# ලෝකය වේගයක් පමණි.

## සංශෝධිත මුද්‍රණය

**පූජ්‍ය ගම්පහ සිරි සීවලි හිමි**

දිමුතු මුද්‍රණාලය
අංක 103/A, නුවර පාර, යක්කල.
දුරː 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපැලː dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්ː www.dhammadanabooks.com

## ධර්ම දානය පිණිස පූජ්‍ය ගම්පහ සිරි සීවලී හිමියන්ගේ සංස්කරණයෙන් ප්‍රකාශිත ග්‍රන්ථ

* ලෝකය වේගයක් පමණි ( 2011.01.30 )
  ( නැවත මුද්‍රණය 2012. 04. 10 )

* නිවන් දැකීම සඳහා සිවුවනක් පිරිස කළයුතු බුද්ධ චර්යාව කුමක්ද? ( 2011 මැයි මස )

* බෝසත් ගෞතම දරුවෝ ( 2012 මාර්තු මස )

* මේ භවයේ දී නිවන් දකින්නේ කෙසේ ද? ( 2012.05.30 )

* ඔබට නිවන් දොර විවර වී ඇත. ( 2011 සැප්තැම්බර් මස )
  ( 2011 - 12 - 30 නැවත මුද්‍රණය)

* භව නිරෝධය හෙවත් සසර ගමන නතර කිරීම
  ( 2012 ජනවාරි මස ), ( 2013.07.30 නැවත මුද්‍රණය)

* නිවනේ වසන්තය ඔබ අබියස (2013.07.30)
  (සංශෝධිත 2වන මුද්‍රණය 2014.09.30)

* සෝවාන් ඵල ලාභිත්වයෙන් අමාශාන්තිය කරා
  (2014.03.30 පලමු මුද්‍රණය)
  ( 2016.01.01 නැවත මුද්‍රණය)
* නිවීමක නිමාවකි නිවන් මග (2015-04-01)

**පූජ්‍ය ගම්පහ සිරි සීවලී හිමි**
**වේළුවනාරාමය,**
**කන්නිමහර - වතුරුගම**
**දුර: 072-4471490, 071-8601245**
**2600 සම්බුද්ධ ජයන්තිය නිමිති කරගෙන ය.**
**ව්‍යවහාර වර්ෂ 2016.03.30**

# පිදුම

නිවන් මග එළිපෙහෙලි කල

සියලුම

ආර්ය උතුමන් වහන්සේලා

වෙත

ගෞරවාදරයෙන් පුදමි.

පූජ්‍ය ගම්පහ සිරි සීවලි හිමි

වේළුවනාරාමය,
කන්නිමහර - වතුරුගම
දුරඃ 072-4471490, 071-8601245
2016.03.30

## ලෝකය වේගයක් පමණි

## පෙළ ගැස්ම


පිටුව

1. පිවිසුම V - VI

2. හිමිකම් අහුරා නැත VII - VIII

3. දසුන IX - XVII

4. ලෝකය වේගයක් පමණි 19 - 28

5. විඤ්ඤානය මායාවක් මිස ප්‍රඥාව නොවේ 29 - 32

6. සියළුම ආයුෂ්ඵල ලාභීත්වය සඳහා විදර්ශනා භාවනාව 33 - 38

7. ලෝකයෙන් අත්මිදීමට අනිච්ච සඤ්ඤාව 39 - 46

8. තීරණාත්මක නික්මීමක් සඳහා 47 - 96

# පිවිසුම

''උපනීයති ලොකො අද්ධුවො'ති බෝ මහාරාජ, තෙන භගවතා ජානතා, පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන පඨමො සම්මුද්දෙසො උද්දිට්ඨෝ යං අහං ඤත්වාච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො''

''මහරජ, මම යම් කිසි නිර්දේශයක් දැකගෙන අසාගෙන සාසනයට පැමිණියෙමි. කුමක්ද? ඒ. ''ලෝකයා ජරාමරණය කරා යාම ඒකාන්තයෙන්ම සිදුවේ. මේ පළමු නිර්දේශය සියල්ල දන්නා - සියල්ල දක්නා භාග්‍යවත් අරහත් සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් වදාරන ලදි''

''අත්තාණො, ලොකො අනභිස්සරො'ති බො මහාරාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙ න දුතියො සම්මුද්දෙසො උද්දිට්ඨො යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො''

''මහරජ, යම්කිසි දෙවන නිර්දේශයක් දැනගෙන - දැකගෙන අහගෙන සාසනයට පැමිණියෙමි. කුමක්ද? ඒ ලෝකයා කිසිම පිහිටක් පිළිසරණක් නොමැතිව සිටි. කුමන කරුණකින්වත් ඔහුට ඇස්වැසිල්ලක් දෙන්න කිසිවෙක් නැත. දෙවන නිර්දේශය භාග්‍යවත්වූ සියල්ල දන්නා සියල්ල දක්නා අර්හත් සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් වදාරණ ලදි.''

''අස්සකො ලොකො සබ්බං පහාය ගමනීයන්ති. බෝ මහාරාජ තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මා සම්බුද්ධෙන තතියෝ සම්මුද්දෙසො උද්දිට්ඨො යං අහං ඤත්වා, ච දිස්වා ච සුත්වාච අගාරස්මා අනාගාරියං පබ්බජිතො''

''මහරජ මම යම් තෙවන ධර්ම නිර්දේශයක් දැනගෙන දැකගෙන ආසාගෙන ශාසනයට පැමිණියෙමි කුමක්ද? ඒ ''ලෝකයේ තමාට අයත් යමක් නැත. සියල්ල හැරපියා යායුතුය'' තුන්වන ධර්ම නිර්දේශය භාග්‍යවත් වූ සියල්ල දක්නාවූ අර්හත් වූ ඒ සම්මා සම්බුදු පියාණන් වහන්සේ විසින් වදාරණ ලදි.''

**''ඌනො ලොකො අතිත්තො තණ්හා දාසො'ති ඛො මහරාජ, තෙන භාගවතා ජානතා පස්සතා අහරතා සම්මා සම්බුද්ධෙන චතුර්ථො ධම්මුද්දෙසො උද්දිට්ඨො යං අහං ඤත්වා ච දිස්වා ච සුත්වා ච අගාරස්මා අනගාරියං පබ්බජිතො''**

''මහරජ, මම යම්කිසි හතරවන ධර්ම නිර්දේශයක් දැනගෙන දැකගෙන අසාගෙන ශාසනයට පැමිණියෙමි ද ඒ ලෝකයා ඌණබවකින් - මදිබවකින් - අතෘප්තිකරව තණ්හාවට දාසයන් බවට පත්වී ඇති බවයි. මේ හතර වන ධර්ම නිර්දේශය භාග්‍යවත් සියල්ල දන්නා වූ සියල්ල දක්නාවූ භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදි.''

# හිමිකම් අහුරා නැත

හිමිකම් අහුරා නැත. දහම් පොතේ සඳහන් දහම් කරුණු ශාන්ති නායකයාණන් වහන්සේ විසින් දේශිත සූත්‍ර පිටකාදී ග්‍රන්ථ වලින් මෙන්ම වියත් උතුමන්ගේ ඇසුරින් දහම් අසා දරාගෙන පොත පත පරිශීලනය කර ලබා ගත් ''අංගමංග'' නිධානයකි. සුළු උගත් කමකි. පොඩි දහම් දැනුමකි.

දහම **''විවටෝ විරෝචති - නපටිච්චන්නෝ''** විවෘර්ත වූ තරමට බබලයි. විවෘත නොවූයේ නම් නොබබලයි. **''මුඛතෝ ජාතෝ - ධම්ම ජෝ - ධම්ම නිම්මිතෝ''** ත්‍රිපිටකයේ අන්තර්ගත උතුම් ධර්මස්කන්ධ බොහෝ ඒවා ශාන්ති නායකයාණන් වහන්සේ විසින් දේශිත ශ්‍රී මුඛ පාඨ වේ. '' ශ්‍රී මුඛයෙන් උපන්නේ වෙයි. එහිම ජාතවිය. ධර්මයෙන්ම නිර්මිතය.'' සියලු ධර්මය විවෘතව නොසඟවා දේශිතය. කාලාම සූත්‍රයෙන් දේශිත පරිදි සිතීමේ විමසීමේ නිදහස ඇතිව අන්තගාමී නොවී එහෙත් දැනගත් ධර්මය තමාගේ කරගන්නේ නැතිව ''ධම්මකථික'' සූත්‍රයෙන් පෙන්වා දෙන පරිදි සමාජගත කළ යුතුවේ.

ධර්මය පහුරක් කරගෙන සසරින් එතරවන්න. කරේ තබා ගන්න එපා! **''ධර්මයත් අත්හරින්න. මහණෙනි''**, **''ධම්මොපි වො භික්ඛවේ පහාතබ්බෝ''** ධර්මය කරපින්නාගත්තොත් ''**අහං**'' හෙවත් ''**මම**'' වර්ධනය වේ.

ධර්මයේ ප්‍රධාන අභිප්‍රාය
* නිහතමානී වීමයි. (මානය නැතිවීම)
* නිරහංකාර වීමයි. (''අහං'' නැතිවීම)
* රහත් වීමයි. (කෙලෙස් නැසීමයි)

වර්තමානයේ දහමට පටහැනි ක්‍රියාමාර්ග සමාජගත වී ඇති බව පෙනේ. දහම් පොත පත ප්‍රකාශන මාධ්‍ය තමාගේ නිර්මාණ බවට පත්කර ''**හිමිකම් අහුරා ඇත**'' ඒ අයට ''**ධම්ම ථෙය්‍ය**'' යනුවෙන් හෙවත් ''**දහම් හොරු**'' බව බුද්ධ භාෂිතයි.

තථාගතයාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පෙරුම් පුරා සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට ස්වයංභූ ඥාණයෙන් අවබෝධ කරගත් ශ්‍රී සද්ධර්මය සකල

ලෝවැසි සත්වයා වෙත මහා කරුණාවෙන් මහා මෛත්‍රියෙන් අබමල් රේණුවක තරම් දෙයක් නොසඟවා ඉතිරි නොකොට ගුරු මුෂ්ටියක් නොමැතිව විවෘතව දේශනා කළහ. (ඒ දහමට වාරණ පනවා නැත.)

සමහර අය **''නිවන් මග සඳහා අත් හරින්න''** කියමින් ඒ දහම තමාගේ කරගෙන බුද්ධිමය දේපල පනත යටතේ නඩු මගට බැසීමට ද සූදානම්ව සිටිති. මානය වර්ධනය වෙනවා මිස මර්ධනය වන්නේ නැත. නිවීම කෙසේවෙතත් වැනසීම ඇත.

මට දහම් ඇස ලබා දීමට මගහෙලි කළ ලොව්තුරා භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු පියාණන් වහන්සේට (සුමේධ තාපසයෝ මෙන්) උත්තමාංගය පොලොවේ පතිත කර නමස්කාර කරමි. අච්ඡින්නව සම්මා සම්බුදු ශාසනය රැකගෙන පරපුරෙන් පරපුරට ග්‍රන්ථ ධුර විදර්ශනා ධුර වශයෙන් ජීවිත පරිත්‍යාගයෙන් ධර්මය සුරැකිව ගෙන ආ සියලුම ආර්‍ය්‍ය මහෝත්තම උතුමන්ට දෙවනුව මහ පොලොවේ වැතිර උත්තමාංගය පොළොවේ පතිත කර නමස්කාර කරමි. නමස්කාර වේවා! නමස්කාර වේවා!! නමස්කාර වේවා!!!

ඒ උතුමන්ගෙන් මා ලබාගත් දහම් දැනුම මෙලෙස ඉදිරිපත් කරන අතර එය රිසිසේ පරිහරනය කරන්න. ගබඩා කරගන්න. බෙදා හරින්න. ඒ සඳහා ඒකාන්තයෙන්ම සැදැහැති ඔබව පූර්ණ අනුමැතියකින් තොරවූ නිදහසක් ඇත. (මේ සටහන පෞද්ගලික මතයකි. කිසිවකු දෝෂ දර්ශනයට ලක්කිරීම සඳහා නොවේ.)

ගම්පහ සිරි සීවලි හිමි.

## දසුන

සියලුම උත්තමාර්ථයන් - සියලුම උත්කෘෂ්ඨ බලාපොරොත්තු - සියලුම විජයග්‍රහණයන් - සියලුම මිදීම් (විමුක්තිය) පුද්ගල සාපේක්ෂතාවය මත හෙවත් කෙනෙකු පදනම් කරගෙන සිදුවීම මානව ක්‍රියාකාරිත්වයේ ස්වභාවයයි. ඒ මහඟු බලාපොරොත්තු ඉටුකිරීමේදී අපෙන් ඉටුවිය යුතු යම් සමාජ මෙහෙවරක් වේ නම් එය සද්භාවයෙන් අවංකවම ඉදිරිපත් කිරීම ක්‍රියාත්මක කිරීම මානව හිතවාදි මනුෂ්‍ය ගුණ ධර්මයක්සේ සැලකුව මනාය.

සෝවාන් ආදී ආර්‍ය්‍ය ඵල ලාභිත්වය වර්තමාන සමාජයේ බුද්ධිමතුන් තුල මෙන්ම සාමාන්‍ය සමාජයේ පුද්ගලයන් තුල දෝලනය වන නිරාකරණය කරගත යුතු ප්‍රශ්නයක් බවට පත් වී ඇත. ඒ සඳහා පිලිතුරු ලැබුනු අයද සිටිති. පිලිතුරු අපේක්ෂාවෙන් ආර්‍ය්‍ය මාර්ගයට පිළිපන් අයද සිටිති.

මෑතක් වන තුරුම '**ආර්‍ය්‍ය ඵල**' පිළිබඳ මාතෘකාව හිනාවට ගැරහීමට ලක්වූ '**උමතු විශ්වාසයක්**' පදනම් වූ '**පිස්සුවකැයි**' බැහැර කර තිබුණි. මේ පිළිබඳව අන්තගාමී නොවී මැදහත්ව ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා බුද්ධි ගෝචර ප්‍රවේශයක් ඇති කර ගත යුතුය.

සම්බුද්ධ ශාසනය නම් මහා පථයේ ජව සම්පන්නව බල සම්පන්නව නිවන ජය ටැඹකරා දිවයන ධාවකයා යෝගාවචරයාය. ඔහුව ඉක්මයාමට දෙවැන්නෙක් නැත. ජවයෙන්, බලයෙන්, ප්‍රඥාවෙන් පොහොසත් ඒ 'ඔබව' දෙවියකුට, බඹෙකුට, මාරයෙකුට පැරදවිය නොහැක. නැවැත්විය නොහැක. නිවන හමුවේ ඔබ අන්තිමයාය. පළමුවැන්නා ද ඔබය.

අර්හත් ඵලය ආදීකොට ඇති ලෝකෝත්තර ආර්‍ය්‍ය ඵලත් ලෞකික පංච අභිඥා අෂ්ඨ සමාපත්ති ඵලත් චිත්ත

දියුණුවෙන් මනුෂ්‍ය චිත්ත සන්තානයෙහි පහළ වන්නා වූ අතිශය නිරාමිෂ වූ ද අතිශය නිරවද්‍ය වූ ද ආශ්වාද ජනක, අද්භූත ජනක, ශ්‍රේෂ්ඨ සිතුවිලි සමුදායක අග්‍රගණ්‍ය ඵලය වේ. මන පූර්වාංගම කරගෙන,මන ශ්‍රේෂ්ඨ කරගෙන,මනෝමය සිතක විඤ්ඤාණ ශක්තියේ ක්‍රියාකාරිත්වයයි.

මේ මිහිපිට උසස් මානසිකත්වයක් ඇතිව මනුෂ්‍යයා පහල වූ වකවානුවේ සිට ඔහු විසින්ම මානසික ඒකාග්‍රතාවයෙන් සිත දියුණු කිරීමෙන් ඇතිකර ගත් ඉහත ලෞකික - ලෝකෝත්තර ඵල හෙවත් ආධ්‍යාත්මික දියුණුව මෙතෙක් ලොව පහළ වූ පහළ වන්නා වූද නවීන විද්‍යාව හමුවේ අනාථ වී නැති අනාථ නොවන පරම උත්කෘෂ්ඨ චිත්ත ශක්ති සමුදායකි. මේ චිත්ත ශක්තියට අභියෝගයක් නැත. අතීතයේ වූයේ ද නැත. අනාගතයේ ද අභියෝගයක් නැත්තේමය. චිත්ත ශක්තිය හමුවේ නවීන විද්‍යාව අසරණය. භෞතික දියුණුව ආධ්‍යාත්මික දියුණුව හමුවේ පරාජිත ය.

සත්‍ය අවබෝධ කල උත්තමයාට වඩා සුඛිත මුදිත සැනසුන පුද්ගලයෙක් මේ තුන් ලෝකයේ කොතැනකවත් නැත. බෞද්ධ දර්ශනය හැර ලොව පහල වූ ආගම් දර්ශන වලින් මිනිසාගේ සදාකාලික විමුක්තිය ලංකර ගත හැක්කේ මරණින් පසුව ය. එහෙත් නව ලෝකෝත්තර ධර්මය හෙවත් අරි අටමග ඵල හා නිවන මේ ජීවිතයේදී ම ලබාගත හැක. චෛතසික දියුණුවේ ශ්‍රේෂ්ඨතම අවස්ථාව අර්හත් ඵලයයි. අවම ඵලය සෝවාන් ඵලයයි. ඒ ආර්ය ඵල ලාභිත්වය ඇති උත්තමයෝ පරිපූර්ණ චෛතසික උපද්‍රව වලින් සදහටම මිදුනෝ වෙති. මානසික ගැටලුවෙන් මිදුනෝ වෙති. පරිපූර්ණ චෛතසික - මානසික සෞඛ්‍යයෙන් යුක්ත වූවෝ වෙති. ඒ ආධ්‍යාත්මික දියුණුවේ උපරිම ඵලය ලොව්තුරා සම්මා සම්බුද්ධත්වයයි. සර්වඥතා ඥානයයි. මේ දිට්ඨධම්මවේදනීය සදාකාලික විමුක්තියයි.

ඔබත් මේ භවයේ දී දිට්ඨධම්මවේදනීය වශයෙන් නිවීම ඇතිකර ගැනීම සඳහා චිත්ත ධෛර්යය ඇතිකර

ගන්න. බුද්ධ ධර්මය යනු ( බුද්ධ, අවබෝධය - ධර්මය - සත්‍යයයි ) සත්‍ය අවබෝධයයි. අසීමිත මිනිස්, හැකියාවන් ඇති මිනිසාට මානසික ශක්තිය පුබුදාගෙන සදාකල්හි විමුක්තිය ළඟාකර දෙන ක්‍රමය හා විධිය උගන්වන ස්වභාව ධර්මය බුදුදහමයි.

මානව හිතවාදී සර්වඥයන් වහන්සේ ඇසට නොපෙනෙන ඉන්ද්‍රිය ගෝචර නොවන සර්වබලධාරී ඊශ්වරයකුට හෝ දෙවියකුට මැවුම්කාරයෙකුට අවිද්‍යා අන්ධකාරයෙහි නිමග්නව තබන විශ්වාසයට වඩා මිනිස් ශක්තියට මිනිස් හැකියාවට මානසික බලයට මුල්තැන දී ඒ බලමහිමයෙන් විමුක්තිය ලඟාකර ගන්නා හැටි සක්සුදක් සේ පහදා දුන්හ. මේ මානසික ශක්තියේ අගය, මහිමය හා බලය පෙන්වා දෙන බුදුදහම මෙතෙක් ලොව පහල වූ ආගම් දර්ශනය අතර, පළමු තැන වැජඹේ. චින්තන නිදහසේ අගය වටහා දී මිනිස් ක්‍රියාකාරකම් වලට මුල්තැන දෙන ලොව පළමු දර්ශනය බුදු දහම පමණි. විශ්මිත මිනිස් හැකියා මගින් සමෘද්ධිය ලබාගත හැකිබව බුදුවදනින් මගපෙන්වා ඇති බව බුද්ධිමත් මිනිසා විසින් දැනටමත් අවබෝධ කරගෙන ඇත.

දීඝ නිකායේ '**බ්‍රහ්ම ජාල**' සූත්‍රයේ බුද්ධ කාලීන භාරත සමාජයේ දෘෂ්ටි කෞතුකාගාරයක්ව පැවති බව පැහැදිලි කරයි. එදා මෙදාතුර ලොව පහළ වූ ආගම් දර්ශන අතර බුදුදහම ස්වාධීන අනන්‍යතාවයක් ඇති එකම දර්ශනයකි. අන්‍ය ආගමික නායකයන් සත්වයා ඇතුළු ලෝක ධාතුව සර්වබලධාරී බ්‍රහ්මයකු නැතහොත් ඊශ්වරයකු නැතහොත් දෙවියකු විසින් මැවූ බවත්, ඒ ගුප්ත මැවුම්කාර නොපෙනෙන මාපකයාට සියල්ල කල හැකියයි පවසමින් දේව දූතයා හෙවත් පණිවිඩකරුවා ඇඟබේරා ගත්තේ ය.

මේ මැවුම්කාර '**මාපකයා**' සම්බන්ධව සොයා බැලීමට හාරා ඇවිස්සීමට අනුගාමිකයන්ට තහනම් ය. ඒවා දේව රහස් ය. දේව වදන් ය. අනුගාමිකයා භක්තිය පදනම් වූ (භක්තිය යනු බියමුසු ඇදහිල්ල) බියමුසු ඇදහිල්ලකට හිරකර මිනිසාගේ ස්වාධීන චින්තනය වූ මානව නිදහස නැති මිත්‍යාදෘෂ්ඨිකයන් කර අන්ධ

භක්තියන් බවට පත් කර ඇත. ඊනියා ලෝකය හා සත්වයා මැවීමේදී දක් වූ කරුණු ඓතිහාසික හා ජීව විද්‍යාත්මක කරුණු පදනම් කර පර්යේෂණ කර සොයා බැලීමේ දී මේ මැවුම්කාර දේව නිර්මාණ වාදය නිකම්ම නිකං හිස් ප්‍රලාපයක් පමණි. 'මැවීම' යනු ප්‍රකෘර්තිය නොව විකෘර්තියකි.

ආදිකාලින මානවකයා සිතාගෙන සිටියේ සත්වයා සහිත මේ භෞතික ලෝකය මවන ලද්දේ මහා බ්‍රහ්මයා විසින් බවයි. ඒ බ්‍රහ්ම නිර්මාණවාදීන්ය සමහරෙක් සිතාගෙන හිටියේ ඊශ්වරයා විසින් බවයි. ඒ ඊශ්වර නිර්මාණ වාදීන්ය. තවකෙක් සිතාගෙන සිටියේ දෙවියන් විසින් බවයි ඒ දේව නිර්මාණ වාදීන්ය. ඒ අතර බහුදේව නිර්මාණ වාදීන්ද බොහෝ විය. බුද්ධියෙන් උසස් අන්ධානුකරණයට නොයන උසස් මානසිකත්වයෙන් හෙබි සත්‍ය ගවේෂකයා මේ නිර්මානවාද - මැවීම් වාද එක හෙලා ප්‍රතික්ෂෙප කරනු ඇත. නොමේරූ මානසිකත්වයෙන් ළදරු මානසිකත්වයෙන් ගෙනහැර දක්වන මේ පලකිරිම් සත්‍ය හා කිසිසේත් සම්බන්ධයක් නැත. බොළඳ ප්‍රකාශ පමණි.

නිර්මාණ වාදීන් ප්‍රකාශකරන පරිදි සර්වබලධාරි වූද සර්වතොභද්‍ර වූද සර්ව සාධාරණ වූ ද අපරිමිත කරුණාවන්ත වූද අපරිමිත දයාවන්ත වූද, අපරිමිත ස්නේහවන්ත වූද මහා බ්‍රහ්මයා හෝ ඊශ්වරයා හෝ මොනයම් වු දෙවියෙක් හෝ සත්වයා හෝ ලෝකය මැව්වේනම් එහි කිසියම් හෝ වැරද්දක් අඩුලුහුඩුවක් - මදි පුංචි කමක් - අඩුවැඩි බවක් කිසියම් හෝ දොෂයක් - පහත් තුච්ඡ බවක් - දීන බවක් - කිසිසේත් විද්‍යමාන විය නොහැක.

ඉහත දක්වූ පරිදි සර්වබලධාරි - සර්ව සාධාරණ - සර්වතොභද්‍ර ආදි ගුණාංගයන්ගෙන් හෙබි යයි කියවෙන මෙම මාපකයා (මැවුම්කරු) විසින් මවන ලද මිනිසා කිසිසේත් කුරිරු - අධම - පාපී - නිහීන දුර්දාන්ත ක්‍රියානොකරනු ඇත මාපකයාටත් අවනත නැති කිසිසේත් යටත් නැති මැවිල්ල මොනයම් හෝ පැත්තකින් සර්තොභද්‍ර හෙවත් සියල්ලෙන් පරිපූර්ණ මැවිල්ලක්

නොවන බව බුද්ධිමත් ඕනෑම කෙනෙකුට පැහැදිලිය.

දුගී දුප්පත් බවෙන් පීඩිතව ලෙඩින් දුකෙන් වෙලී පැටලී මිරිකී සිටින්නන් අනන්තය, අප්‍රමාණය. අඳ - ගොළු - බිහිරි - අබ්බගාත සත්වයෝ බොහෝ වෙති. මන්‍ද බුද්ධිකයන් එමටය. මුළු ජීවිතයම දුක් ගොඩකි. නිවිල්ලක් සැනසිල්ලක් පේනතෙක්මානේ නැත. මැවුම් කරු මේ සියල්ලටම වගකිව යුතුය. මාපකයා විසින් මවන ලදැයි කියන මේ භෞතික ලෝකයේ විශාල ජල ගැලිම් - නාය යෑම් - ගිනිකඳු පිපිරීම් - භූමිකම්පා - සුනාමි ව්‍යසන ලැව්ගිනි ආදිය එමටය. මවන ලද මිනිසාද ඇතුලු සත්වවර්ගයාම අඩා වැලපෙමින් වැලලී යයි. පණ පිටින් වලදා දමයි. අපරිමිත දයාවන්ත කරුණාවන්ත වූ ද මාපකයා කෙසේ නම් මේ ව්‍යසන දිහා බලා සිටින්නේද? මාපකයාටවත් පාලනය කල නොහැකි ලෝකයක හැටි!

සර්ව තොහද්‍ර මැවිල්ලවූ මිනිසා සත්වයා ජරාවට පත්වේ. මරණය කරා යයි. ලෙඩදුක් පීඩා වල අවසානයක් නැත. බඩට කන්න නැතිව ඉන්න තැනක් නැතිව - ලෙඩට බෙහෙතක් නැතිව - අඳින්න ඇඳුමක් නැතිව - සාපිපාසා වලින් පීඩිතව දෙවියන් යදිමින් සිටියදී මරණය වැළඳගනී. සීතලෙන් මැරෙයි. උෂ්ණාධික කමින් මියයයි.

අභ්‍යන්තර ලෝකය (නාම) හා බාහිර භෞතික ලෝකය (රූප) විෂමය, විවිධය. අසාධ්‍ය මානසික - කායික ලෙඩ දුක් වලින් පීඩා විඳින්නන් එමටය. නිරෝගී අයද වෙති. බොහෝ කාලයක් ජීවත්වන්නන් මෙන්ම අල්පායුෂ්ක අයද වෙති. ඉතාමත් විරූපී අවලක්ෂණ අය එමටය. ඉතාමත් සුරූපී සුන්දර අයද ඒ අතර වේ. ධනවතුන්ද දුප්පතුන් ද විවිධය. අවි ආයුධ තනා මිනිස් සංහාරය කරති. වස - විෂ කවා සත්වයන් ඝාතනය කරති. අවි-ආයුධ-මත්ද්‍රව්‍ය වෙළඳාම් මෙන්ම මිනිස් වෙළඳාම් ද කර ධනය උපයන් මිනිසුන් සිටිත්. මිනිසුන් මරති, ස්ත්‍රීන් දූෂණය කර මරා දමති, අවිහිංසක හිරිමල් කැකුළු වන් අත දරුවන්ට මහපොළොව නුහුලන අපරාධ කරති, මේ සියල්ල දේව කැමැත්තට සිදුවේද? හැබැයි දෙවියන් හෝ ඊෂ්වරයා හෝ බ්‍රහ්මයා ඒ අය හොඳින් ආරක්ෂා කරනු ලබන බව නම් පෙනේ. ඒ අයට බොහෝ කාලයක් අපරාධ කරමින් ජීවිතය ගත කිරීමට දීර්ඝායුෂ

දෙති. නිරෝගී සුවයෙන් අපරාධ කිරීමට රැකවරණය ආරක්ෂාව දෙවියන් දෙන බව නම් පෙනේ. මේවා, දෙවියන්ගේ හෝ බ්‍රහ්මයාගේ මාපකයාගේ පරීක්ෂා කිරීමක්ද? - කැමැත්තද? යනු විමසිය යුතුය. සමහරු කියන්නේ පාඩම් ඉගැන්වීමට කියාය. එහෙත් පාඩම් ඉගැන්විය යුත්තේ නිර්දෝෂී අයට නොවේ. දූෂිත පාපතරයන්ටය. ඒ බව ඕනෑම මොලේ ඇති කෙනෙකුට වුවද වැටහෙනවා ඇත. ලෝක මාපකයාගේ ක්‍රියා කලාපය ඉතා නින්දිතයි. අසාධාරණයි. බුද්ධිමතුන් මේ විනිශ්චය එකහෙලා ප්‍රතික්ෂේප කරනු ඇත. දේව-බ්‍රහ්ම-ඊශ්වර ආදී මාපකයන්ගේ කරුණාව-දයාව-මෛත්‍රිය සැමටම පොදු විය යුතුය.

අන්ධ විශ්වාස - ඇදහිලි - කන්නලව් - වන්දනාමාන යාඥා කිරීම් - වැදවැටීම් - යැදීම් පිදීම් පුහු ආටෝප යෙන් යුත් පුදපූජා ගිතිකා ගායනා පිරිසිදු බුදු දහමේ නැත. ඉහත කී සියල්ල බුදු දහමට කිසිසේත් අදාල නොවන වෙනත් ආගමික දර්ශන හා සම්බන්ධ ආවතේව පමණි.

බුද්ධියට මුල්තැන දෙන නිසල මනක ප්‍රබුද්ධත්වය ඔප්නන්වන මහාමුනි දර්ශනය ඉහත කී පලිබෝධ වලින් වල්මත්වී නැත. පසු කාලීන ආමිෂය නමින් බුද්ධ ශාසනයට රිංගාගත් දුෂ්ටි මතවාද නිසා - ඇදහිලි ආවතේව නිසා බුද්ධ ශ්‍රවකයා අතරමංවී ඇත. නූතන බුදු දහම හරය වෙනුවට ඔපයට මුල්තැන දී ඇත. නිදහස් චින්තනයට සත්‍ය ගවේෂණයට භක්තිය මරු පහරකි. **ඒනිසා අධික්ෂණය, නිරීක්ෂණය, පර්යේෂණයෙන් ප්‍රතිපත්තියෙන් ප්‍රතිවේධයට යායුතුය. ප්‍රත්‍යක්ෂකල යුතුය.** චින්තන ශක්තිය අභිබවා කිසිම කායික ශක්තියක් භෞතික ශක්තියක් දේව බලයක් කවරාකාරයකින් හෝ හට නොගනි. හිත හදනවා යනු ලෝකය හැදීමයි. දූෂිත සිතකට සියලුම ලෝක ධාතුන් ද විනාශ කල හැක. ඒ සිතම ලෝකයෙන් එතර වීම සදහා මහෝපකාරිවේ. ''**චිත්තං දන්තං සුඛාවහං**'' විශ්ව නිර්මාපකයාගේ සියළු ශක්තිය බලරහිත කිරිමේ ශක්තිය චේතනාවට හැකියාව ඇත. **ආත්මගරුත්වයක් නැති අනුනගේම උපකාරයම**

**උදව්වම රැකවරණය බලා පොරොත්තුවන ස්වකීය මිනිස් බුද්ධියට නිගාදෙන අනුන්මත තමාගේ යැපීම් ඇතැයි සිතන බෙලහීන ස්වකීයත්වය වටිනාකම නොදත් අභ්‍යන්තර ගුණවගාව පසෙකලා අනුනගේ පහනින් එලිය බලාපොරොත්තු වන නොයෙකුත් බලවේග හමුවේ වැඳ වැටෙන දීනත්වයෙන් අසාධයට ගිය යාඥාවට, කන්නලව්වට, මුල්තැන දෙන මන්ද බුද්ධිකයන්ට බුදු දහම හොද පාඩමකි.** කිසිම ආගමක තම ශ්‍රාවකයන්ට අනුගාමිකයන්ට දේවත්වයට බ්‍රහ්මත්තවයට පත්විය නොහැක. බුදු දහමේ සියලුම ශ්‍රාවකයන්ට තමනට අභිමතය පරිදි ''බුදුවිය'' හැක.

අනුගාමිකයා හොඳ කළ යුත්තේ ශාස්තෘවරයා (දෙවියන්) සතුටු කිරීම සඳහාය. නරක නොකල යුත්තේ දේව උදහසට හසු නොවීම සඳහාය. මේ නිසාවෙන් මිනිසා දමනය කර තියෙන්නේ බුද්ධියෙන් හීන තිරිසනුන් දමනය කරන ක්‍රමයකටය.

බුද්ධියට මුල්තැන දුන් චින්තන හැකියාවට මුල් තැන දුන් ශාන්තිනායකයාණන් වහන්සේ මිනිසාට මගනොමග කියා දුන්නේ සිතෙන් - කයෙන් - වචනයෙන් පව් කලොත් ඔහුගේ පරාජය - පිරිහීම - දුක- සෝකය - සංතාපය සිදුවන බව හේතුඵල දහම පදනම් කරගෙනය. තමාගේ ගැලවීම විමුක්තිය කෙනෙකු වෙත පැවරීම කිසිසේත් බුද්ධිගෝචර නොවේ.

ශාන්ති නායකයාණන් වහන්සේ අවිඤ්ඤානක හෙවත් අචේතනික භෞතික ලෝකය හා සවිඤ්ඤානක හෙවත් සචේතනික නාමලෝකය (සිත) හේතුවක් නිසා හටගත් බව පැහැදිලි කරති.

විශ්වය නිර්මාණය පෙන්නුම් කරන්නේ ධාතුන්ගේ හෙවත්ශක්ති සමූහයක ප්‍රභවය මගිනි. එම ශක්ති විශ්වයේ සදාකාලිකව විද්‍යාමාන වන

01. පඨවි
02. ආපෝ
03. තේජෝ

04. වායෝ
05. ආකාශ (අවකාශය)
06. විඤ්ඤාණ, වේ

මේ ධාතු හෙවත් ශක්ති නිතරම අතරක් නැතිව චලනය වේ. ප්‍රවර්තනය වේ. වෙනස් වේ. වේගවත් වේ. මේ වේගවත් වීම, චලනය, ප්‍රවර්තනය, ස්වයම්භූ හෙවත් ඒ ඒ ශක්තිවලටම ආවේණික ධර්මතාවයකි. මෙයින් මුල් හතර එකට ගොනුවක් වශයෙන් පුංජයක් වශයෙන් අවකාශය තුල දිදුලන ස්වභාවය, ප්‍රකටවන බව ඉස්මතුවීම ස්වාභාවිකයි. ඒවාට ''**රූප**'' නම යෙදී ඇත. රූප දෙකක් ස්වභාවයෙන් එකතුවීම නිසා ''**විඤ්ඤාණය**'' නම් ශක්තිය ප්‍රකට වේ. විඤ්ඤාණ ශක්තිය හට ගැනීමේදී පෙර පසු නැතිව '**නාම**' ධර්ම ප්‍රකට කරයි. මේ විඤ්ඤාණ - නාම - රූප සංකලනය සතා වේ. පුද්ගලයා වේ. විඤ්ඤාණ ශක්තිය නොමැති රූප ධර්ම පමණක් වේ නම් ඒ ගස් ගල් පර්වත බාහිර මහ පොලව ආදී සංකත ධර්ම වේ. මේ සංකත අචේතනික සචේතනික සියලු දෑ ධාතු නිසා නම් ප්‍රකට වන්නේ සියලු ශක්ති වේගය පදනම් ව සිදුවිය යුතුය. වේගය යනු, ශක්තිය යනු ඇති වෙනවා නැතිවෙනවා 'අනිත්‍යයි' යමක් අනිත්‍ය නම් දුකයි. යමක් දුකනම් අනාත්මයි.

- ★ **යද නිච්චං**
- ★ **තං දුක්ඛං**
- ★ **යං දුක්ඛං**
- ★ **තද නත්තා**

ශක්ති විශ්වය තුල වේගවත් වී තිබෙන තාක් කල්, විඤ්ඤාණ නාම රූප (සත්‍වයා) පහලවීම ස්වාභාවිකයි. එහි හට ගැනීම අගක් මුලක් කෙලවරක් නැති අචින්ත වූ

ධර්මතාවයකි.

ප්‍රතිපත්තිමය ක්‍රියා දාමයක් තුළින්මයි විමුක්තිය ලබාගත හැක්කේ. ප්‍රාර්ථනා කිරීමෙන්, යැදීමෙන්, යාඥා කිරීමෙන්, වැඳ වැටීමෙන් කවදාවත් විමුක්තියක්, සහනයක්, සැපතක්, බලාපොරොත්තු විය නොහැක. එය සිහිනයක් පමණි. එය යථාර්ථය නොවේ. යාඥා කිරීම, ප්‍රාර්ථනා කිරීම, යැදීම, අමනෝඥ බෙලහීනයන්ගේ පහත් ක්‍රියාවක් පමණි. බුද්ධියට නිගා කිරීමකි.

**අත්තාහිඅත්තනො නාථො - කෝහි නාථො පරොසියා**
**අත්තනාව සුදත්තෙන - නාථං ලභති දුල්ලභං**

තමාට තමා පිහිටය. වෙන කෙනෙකුගේ (දෙවියකුගේ ශාස්තෘවරයකු) පිහිටක් කොයින්ද ? තමා විසින් දමනය කරන ලද සිත තමාට ලොව්තුරු සැප ඇති කරවයි. සසර ගමන නතර කරයි.

**අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති**
**අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති**
**සුද්ධි විසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤො විසෝධයෙ**

තමාගේ සිතේ පිරිසිදු බවට හෝ අපිරිසිදු බවට තමාම වග කිව යුතුය. ( තමා කල අකුසලය තමාව අපිරිසිදු කරයි ) තමාට හැර පරිබාහිර ලෝකයේ දෙවියෙකුට බ්‍රහ්මයකුට පිරිසිදු බව, අපිරිසිදු බව කල නොහැක. ප්‍රඥාවන්තයන් ට මිසක් අනුවන අයට මේ බව නොවැටහෙයි. අවිද්‍යා අන්ධකාරයෙන් අඳුරෙන් අඳුරට මේ අය ගමන්කර ලබාගත් උතුම් මනුෂ්‍ය භාවය නිසිමගට යොමු නොකිරීමේ ආදීනවයෙන් අපාගත වේ. සදාකාලික විමුක්ති මාර්ගය ඇත්තේ බුදු සසුනේ පමණි. කිසිම ආගමක දහමක මේ සැනසීම නැත.

**ගම්පහ සිරි සීවලී හිමි.**

# ලෝකය වේගයක් පමණි

හැම රූපයක්ම විශ්ලේෂණය කරලා බැලුවොත් පේනවා විශ්වයේ ශක්ති බව. ශක්ති අතර අවබෝධයට පත් වුණාම **පටිච්ච සමුප්පන්න** දර්ශනය තේරුම් ගන්න පුළුවන් වෙනවා.

රූපය තුලත් අරූපය තුලත් මේ ධර්මතාවය සිදු වෙනවා. එහිදී පරම අංශුවකවත් ස්ථාවර නොවන නිසා '**ඨිති**' ස්වභාවයක් '**භංග**' ස්වභාවයත් මොනම ක්‍රමයකින් පෙන්වන්න බැරි බව පැහැදිලිය.

මේ ශක්ති අතර මන මෙහෙය වන්න ඉන්ද්‍රිය භාවනාව වැඩිය යුතුය. ඇස, ඇසට ගෝචර වන වර්ණ රූප - කණ, කණට ගෝචරවන ශබ්ද රූප - නාසය, නාසයට ගෝචර වන ඝන්ධ රූප ආදී අභ්‍යන්තර බාහිර සෑම රූපයක්ම '**අවකාශ**' භූමිය කරගෙන ව්‍යාප්ත වෙලා තියෙන්නේ. අභ්‍යන්තර රූප හා බාහිර රූප සම්බන්ධිකරණයෙන් එක්වීමෙන් හැදෙන චක්ඛු විඤ්ඤාණ ධාතුව - සෝත විඤ්ඤාණ ධාතුව ආදී වශයෙන් හටගන්නා විඤ්ඤාණ ශක්තිය නොපෙනුනාට අවකාශයම තමයි භූමිය කර ගන්නේ. මසැසින් දකින්න බැහැ. නොපෙනෙන බවයි දහම නොඅසන පෘතජ්ජනයාට ප්‍රශ්නයක්ව පවතින්නේ. අවබෝධ කරගන්නම වෙනවා සියළු ශක්ති ගොඩ නැගෙන්නේ අවකාශ භූමිය කරගෙන. ශක්තීන්ගේ වෙනස්වීම - චලනය - වේගය නිසා අවකාශය තුල ප්‍රතිබිම්බයක් වශයෙන් ප්‍රකට වන ස්වභායට 'රූපය' නම්වූ සම්මුතිය යෙදී ඇත. ප්‍රකටවන ගොඩනැගෙන ශක්තිවල ඝනකමට (ඝන සංඥා) තමයි අපි රූප කියන්නේ. ඉන්ද්‍රිය ගෝචර

වන ආකාරයට හැඩතල අනුව (වර්ණ-ගන්ධ-රස-ඕජා) තමයි 'නම්-ගොත්' තබන්නේ ඕලාරික තත්ත්වයන් තුල මනසිකාරය නොවන්නට '**යථාභූත ඥාණය**' අවශ්‍යයි.

වෙන්කරලා දක්වන ඇස- වර්ණ රූපය, චක්ඛු විඥ්ඥානය අවකාශ ධාතුව වහගෙන මතුවන ඕලාරික තත්‍වයන් විශ්ලේෂණය කර බලන්න වෙනවා. ඒවා තුල ගැඹුරින් ගැඹුරින්ම අනිත්‍ය-දුක්ඛ-අනාත්ම තත්‍වය ත්‍රිලක්ෂණය මනසට ප්‍රත්‍යක්ෂ විය යුතුය.

ධාතුන්ගේ හෙවත් ශක්තීන්ගේ හෙවත් සුද්ධ ධර්මයන්ගේ පරිවර්තනශීලී බව අතරක් නැතිව නිරන්තරව පෙර ලෙස සුළු බව, වෙනස් වන බව **ධම්මට්ඨිතිතාවයයි. ධම්ම නියාමතාවයයි.** මෙහිදී 'ධම්ම' යන්නෙන් ස්වභාව හටගැනීමත් නිරුද්ධ වීමත් ප්‍රකාශ වේ. **නිරුද්ධ වීමේ ශූන්‍යත්‍වය හට ගැනීමයි.** **හටගැනීමේ ශූන්‍යත්‍වය නිරුද්ධවීමයි.** මෙයට 'පුනර්භවය' වචනය යෙදී ඇත. 'පුනර්' යනු නැවත යන්නයි. '**භව**' පහලවීම හෙවත් හටගැනීමාර්ථයි. හැම සංකත ධර්මයක්ම මේ ධර්මතාවයට හෙවත් '**පුනර්භව**' ස්වභාවයට ස්වභාවයෙන්ම යටත්ය. මෙය ලෝක ධර්මයන්ගේ '**ධම්ම නියාමතාවයයි.**'' මෙය '**ධම්මට්ඨිතා**' '**ඉදප්පච්චයතා**' යනුවෙන්ද සඳහන් වන්නේ මෙයයි.

මේබව සං.නි. පච්චය සූත්‍රයේ '**උප්පාදවා තථාගතා නං අනුප්පාදාවා තථාගතානං ඨිතාව සධාතු ධම්මට්ඨිතිථා, ධම්ම නියාමතා - ඉදප්පච්චයතා**'' යනුවෙන් සඳහන් වේ.

''තථාගතයාණන් වහන්සේලා ඉපදුනද - නොඉපදුනද ධාතුන්ගේ (ශක්තීන්ගේ) ධර්මයන්ගේ

පැවැත්ම ලොව ඇත්තේය'' (ප්‍රවර්තනය-ඇතිවීම-නැතිවීම) අවකාශ ධාතුව වැහෙන කොට රූප මතුවෙනවා. රූපවල ස්වභාවය කියන්නේ ශක්තිවල සංකමයි. ශක්තිවල ස්වභාවය තමයි, නිරන්තර පටිච්ච සමුප්පන්න වීම. තියෙන ස්වභාවය නිරතුරු වෙනස්වීම, පරිවර්තනශීලී ක්‍රියාකාරීත්වය කියන්නේ. ඒ බව අවබෝධ කටයුතුමය. නිරතුරු සිදුවන මේ ක්‍රියාවලියේ එකදු අංශුවක්වත් ඒකකයක්වත් ස්ථාවරව පවතින්නේ නැත. මේ මහා චලිතය-මහා වේගය - ශක්තීන්ගේ විෂමය තුල නිරතුරු සිදුවන අන්‍යොන්‍ය වෙනස, එනම් සමතුලිතය කෙරේ වන ක්‍රියාව අසමතුලිතයේ සමතුලිතය ලෙසටත්, සමතුලිතයේ අසමතුලිතය ලෙසටත් අතෝරක් නැතිව, ඉමක් නැතිව හිඩසක් නැතිව අසංඛ්‍යම වේ. මුළු විශ්වයම ක්‍රියා සන්තතියකි. මේ ක්‍රියාවලිය තුල මහා විශ්වයම මහා චලිතයකි. ''**ලෝකයම වේගයකි**''. එයට ආරම්භයක් - අවසානයක් නැති, නොනිම්ව සිදුවන මහා ජාලයක ශක්ති ප්‍රභවයකි. භාග්‍යවතුන් වහන්සේ මෙය '**අනිත්‍යතාවය**' ලෙස දේශනා කලහ. ('**අනිත්‍යයි - නිත්‍යයයි**' '**අනිච්චනිච්චා සමනාවදන්ති**') මේ අනිත්‍යතාවයට යටත් නොවන ලෝකයේ කිසිවක් කිසිම කෙනෙක් නැති නිසා කොටස් කර දක්වන චක්ඛු - සෝත - ඝාණ ආදී අභ්‍යන්තර ඉන්ද්‍රිය ද වර්ණ රූප - ශබ්ධ රූප - ගන්ධ රූප ආදී බාහිර අභ්‍යන්තර රූප සංයෝගයෙන් ප්‍රකටවන විඤ්ඤාණ ශක්තියද අනිත්‍යතාවයට යටත් නිසා ඒවායේ කිසිදු ස්ථිර පැවැත්මක් නැති බව අවබෝධකර ගතයුතු වෙනවා. රූප අරූප තුල යථාභූත ඥානය තිබේ නම් මේ අවබෝධයට ඔබට පැමිණිය හැක. අනිත්‍ය වූ රූපය නිත්‍ය වශයෙන් අල්ලා ගන්නාතාක් 'දුක' අල්ලා ගත්තා වේ. රූපයේ යථා භූත ඤාණයට පැමිණීමෙන් අත්හැරීමේ ධර්මතාවයෙන් 'දුක'

හටනොගන්නා තැනට කටයුතු කරගත හැකි වේ. රූපයෙන් නිදහස් වීම ලෝකයෙන් නිදහස් වීම වේ. හෙවත් දුකෙන් නිදහස් වීමම එයම වේ. **'නිවන'** රූපමය මනස නොවන නිසාය.

ඉතා කුඩා අංශු වලට විද්‍යාඥයන් 'පරමාණු වශයෙන් නම් කර ඇත. පරමාණු අසංඛ්‍යව අතොරක් නැතිව අවකාශය තුල ක්‍රියාකාරීත්වයේ නැවැත්මෙන් තොරව ප්‍රවර්ථනය වේ. මේ පදාර්ථයන්ගේ නිවරදි හැඳින්වීම කල ගෞතම බුදු පියාණන් වහන්සේ සියළු සංස්කාරයෝ අනිත්‍ය ලෙස දේශනාකර ඇත්තේ මේ ධර්මතාවයයි. ඒ බව සංයුක්ත නිකාය අස්සු සූත්‍රයේ මෙසේ දැක්වේ. **'යාවඤ්චිදං භික්ඛවේ, අලමේව සබ්බ සංඛාරේසු නිබ්බින්දිතං අලං විරජ්ජිතුං - අලං විමුච්චිතුං'**

**'එනිසා මහණෙනි, සියළු සංස්කාරයන් හටගත් දේ පිළිබඳව කලකිරීමට හෙවත් නිර්විඤනයට, විරාගයට, මිදීමට, පැමිණීමට සුදුසු වන්නේය.'**

භාග්‍යවතුන් වහන්සේ විශ්වය පිළිබඳ නිරීක්ෂණය පරීක්ෂණයේ දී යථාභූත ඥානය පිළිබඳ අවබෝධ ඥාණයේ දී වස්තුවේ ස්කන්ධයේ පදාර්ථය ඉක්මවා පරමාණු ඉක්මවා ඉලෙක්ට්‍රෝන - ප්‍රෝටෝන - න්‍යෂ්ඨියේ ශක්ති පුංජයන් ඉක්මවා පරමාණු සර්භයේ ශක්තිය ඉක්මවා අවකාශයේ මායිම් ඉක්මවා මහා විශ්වයේ අචින්ත්‍යය වෙත පැමිණියහ.

★ හටගැනීම 'භව' වේ.
  **නිරෝධ නැතිවීම වේ. එනම් අනිත්‍යයයි.**

★ ඇතිවීම සමුදය වේ.

නැතිවීම අස්ථංගමය වේ. **එනම් අනිත්‍යය වේ.**

- ★ උදය හටගැනීම වේ.
  වය නැතිවීම වේ. **එනම් අනිත්‍ය වේ.**

මේ වෙනස්වීම ස්වභාවිකය. ස්වභාව ධර්මයේ ස්වභාවයයි. චලනය චලනයක්ම පමණි. චලිතයෙක් නැත. හෙවත් චලනය කරන්නෙක් නැත.

චලනය තෙමේම චලනයකි. මුළු විශ්වයම චලනයකි. '**ලෝකයම වේගයකි.**' එසේ හෙයින් ජීවිතයත්, චලනයත් දෙකක් නොවේ. එකමකි. චින්තනය චින්තනයක් මිස චින්තකයෙක් නැත. චින්තනය ඉවත්කල විට චින්තකයාද ඉවත් වේ. '**සිතමි**' අත්හල විට '**මම**' ද ඉවත් වේ.

## I රූපය

**01. 'එවමේව රාධ, තුම්හෙහි. රූපං විකිරථ!'**
මෙසේ රාධ, ඔබ රූපය විසුරුවා හරින්න. බිඳලන්න. (අවකාශය තුල ඡධාතුන්හි දිදුලන ස්වභාවය මනසින් දැකීම)

**02. 'විධමථ!**
රාධ ඔබ රූපය විනාශ කරන්න. (රූපයේ ස්වභාවය ධාතුන්ගේ සමවාමයෙන් ඒකීයත්වයක් බවට පත්වන බව මනසින් දැකීම.)

**03. 'විද්ධවං සේථ!'**
විනාශ කිරීමට කටයුතු කරන්න.

**04. 'විකීලනිකං කරෝථ!'**
නැවත ක්‍රීඩා කිරීමට ගත නොහැකි ලෙස විනාශ කරන්න.

**05. 'තණ්හක්ඛයාය පටිපජ්ජථ!'**
තණ්හාව ක්‍ෂය කිරීම සඳහා පිලිපදින්න.

**06. 'තණ්හක්ඛයෝ හි රාධ, නිබ්බාණං'**
රාධ, තණ්හාව ක්‍ෂය කිරීමම නිවණම වේ.

මේ ආකාරයෙන්
2. වේදනාව ද
3. සංඥාව ද
4. සංඛාරයන් ද
5. විඤ්ඤානය ද නුවණින් දකින්න.

## II වේදනං

**01. එවමේව රාධ, තුම්යෙහි වේදනං විකිරථ!**
**02. විධමථ!**
**03. විද්ධවං සේථ!**
**04. විකිලනිකං කරෝථ!**
**05. තණ්හක්ඛයාය පටිපජ්ජථ!**
**06. තණ්හක්ඛයො හි රාධ, නිබ්බාණනං.**

**මෙසේ රූප - වේදනා - සංඥා - සංඛාර - විඤ්ඤාණ යන පංච උපාදානස්කන්ධයම** යථාර්ථය හෙවත් ප්‍රකෘර්තිය විදර්ශනාවට, ප්‍රඥාවට යොමු කිරීමෙන් විසිවැදෑරුම් සක්කාය දිට්ඨිය ප්‍රහාණය වේ.

ඒ මෙසේයි.

**01.'නරූපං අත්තනො සමනුපස්සති' -**
රූපය ආත්මය නොවන බවත්

**02.'නරූපවන්තං අත්තානං' -**
ආත්මය රූපය නොවන බවත්

**03.'න අත්තානි රූපං' -** ආත්මයෙහි රූපය නැති බවත්

**04.න රූපස්මිං අත්තානං' -**
රූපයෙහි ආත්මය නැති බවත්

**05.න වේදනං අත්තානො සමනුපස්සති -**
වේදනාව ආත්මය නොවන බවත්

**06.න වේදවන්තං අත්තානං -**
ආත්මය වේදනාව නොවන බවත්

**07.න අත්තානි වේදනං -**
ආත්මයෙහි වේදනාව නැති බවත්

**08.න වේදනස්මිං අත්තානං -**
වේදනාවෙහි ආත්මය නැති බවත්

**09.න සංඥා අත්තනො සමනුපස්සති -**
සංඥාව ආත්මය නොවන බවත්

**10.න සංඥං අත්තානං -**
ආත්මය සංඥාව නොවන බවත්

**11.න අත්තානි සංඥං -**
ආත්මයෙහි සංඥාව නැති බවත්

12. **න සඤ්ඤස්මිං අත්තානං -**
සඤ්ඤාවෙහි ආත්මය නොමැති බව

13. **න සංඛාරා අත්තනො සමනුපස්සති -**
සංඛාර ආත්මය නොමැති බව

14. **න සංඛාරං අත්තානං -**
ආත්මය සංඛාර නොවන බවත්

15. **න අත්තානි සංඛාරං -**
ආත්මයෙහි සංඛාර නොමැති බවත්

16. **න සංඛාරස්මිං අත්තානං -**
සංඛාරයන්හි ආත්මය නැති බවත්

17. **න විඤ්ඤානං අත්තනො සමනුපස්සති -**
විඤ්ඤානය ආත්මය නොවන බවත්

18. **න විඤ්ඤ නවන්තං අත්තානං -**
ආත්මය විඤ්ඤානය නොවන බවත්

19. **න අත්තානි විඤ්ඤානං -**
ආත්මයෙහි විඤ්ඤානය නොමැති බවත්

20. **න විඤ්ඤානස්මිං අත්තානං -**
විඤ්ඤානයෙහි ආත්මය නැති බවත්

අනුපිලිවෙලින්

01. රූපය ආත්මය නොවන බවත්
02. ආත්මය රූපය නොවන බවත්
03. ආත්මයෙහි රූපය නොවන බවත්
04. රූපයෙහි ආත්මය නොවන බවත් - මෙසේ,

01. රූප, 02. වේදනා 03. සංඥා 04. සංකාර 5. විඤ්ඤාණ ඉහත හතර ආකාරයට දැකීම නිසා. (4 x 5 = 20) විසි වැදෑරුම් සක්කාය දිට්ඨිය නැති වේ. මෙම ග්‍රන්ථයේ සඳහන් තිලකුණු භාවනාව, විදර්ශනා භාවනාව, ඒ සඳහා නිර්දේශිතයි. එය බුද්ධානුමත කමටහනකි. 'සුද්ධ ධම්මා පවත්තන්ති' පඨවි, අපෝ, තේජෝ, වායෝ විඤ්ඤාණ ශක්ති ප්‍රවර්තනය මතින් හෙවත් ධාතුන්ගේ වේගවත්වීම චලනයෙන් අවකාශය තුල ප්‍රතිබිම්බයක් වශයෙන් විඤ්ඤාණ - නාම - රූප නම්වූ ස්වභාවය විද්‍යාමාන වේ. මෙහිදී භෞතික වූ රූප දැකීම යනු විඤ්ඤාණ මායාවක් බව මුනින්ද්‍රයාණන් වහන්සේ පැහැදිලි කරති.

**මේ විඤ්ඤාණ මායාවට මෙහා සිදුවන සියලු දෑ මායාවන්ය. එතැනින් අවිද්‍යාවේ උපත වේ. මෙම කඩඉමට පත්වීමට ප්‍රථම හෙවත් ලෞකිකත්වයට ඒමට සම්ප්‍රාප්ත වීමට ප්‍රථම ස්වභාවය යථාර්ථය විදූ ඇසින් දැකීම මහා ප්‍රඥාව වේ. එයම ලෝකෝත්තර වේ. මොකද භෞතික දේ ලෞකික වන නිසාය.**

01. **චක්ඛුං උදපාදි යනු,** භෞතික ලෝකය තුල පැනවිය නොහැකි ධර්මතාවයකි.

**02.** **ඤාණං උදපාදි යනු,** භෞතික ලෝකය තුල පැනවිය නොහැකි ධර්මතාවයකි.

**03.** **පඤ්ඤා උදපාදි යනු,** භෞතික ලෝකය තුල පැනවිය නොහැකි ධර්මතාවයකි.

**04.** **විජ්ජා උදපාදි යනු,** භෞතික ලෝකය තුල පැනවිය නොහැකි ධර්මතාවයකි.

**05.** **ආලෝකො උදපාදි යනු,** භෞතික ලෝකය තුල පැනවිය නොහැකි ධර්මතාවයකි.

ඉහත දැක්වෙන ධර්මතා මාංසය මය මනසට ගෝචර නොවන ලෝකෝත්තර තත්වයක් වේ. මාංසම මනස ලෞකිකත්වයකි. ලෞකික යනු සම්මුතියයි. සම්මුති යනු, පනවා ගැනීමයි. පනවා ගැනීම් විද්‍යාව නොවන බැවිනි.

## විඤ්ඤානය මායාවක් මිස ප්‍රඥාව නොවේ.

බරණැස ඉසිපතනයේ මිගදායේ **අනුත්තර ධම්ම චක්ක ප්‍රවර්තනය** මගින් මෙතෙක් මනසින් මවාගත් **'නැති'** දෙයක් **'ඇති'** දේ හැටියට දෘෂ්ඨිගතව එල්බගත් වැරදි ආකල්ප මතින් හටගත් විඤ්ඤාණය නිෂේධනය කල ඒ උතුමෝ **'සෝපධි ශේෂ නිර්වාණ ධාතුව'** ශාක්ෂාත් කළහ.

**''විඤ්ඤානස්ස නිරෝධෙන**
**නත්ථි දුක්ඛකන්ධස්ස සම්භවො''**

විඤ්ඤානයාගේ නිරෝධයෙන් දුක හෙවත් හිත හටගැනීමක් නැත. **'ලෝකය වේගයක් බව දැකීමයි.'** 'මම' යයි - 'මගේ' යයි - 'මගේ ආත්මය' යයි වරද්දවා ගත් ආත්ම දෘෂ්ඨිය මානසිකත්වයෙන් සදහටම මිදීම වේ.

පටිච්ච සමුප්පාදය මෙනෙහි කිරීම නොව දර්ශනය වෙත පැමිණීමයි. මෙහිදී සිදුවන්නේ මෙම අවස්ථාවේදී කිසිත් නැති කිසිවෙක් නැති සංඥා විරහිත විඤ්ඤාණ විරහිත යථාර්ථය දර්ශනය වනු ඇත. මනසිකාරයෙන් පසු වන **අනිමිත්ත ලෝකෝත්තර සමාධිය** වේ. 'අනු' ඉක්මවා ගිය යනු, අනුත්තරයි. 'නිමිති' හෙවත් සංඥා නොමැති බවයි.

නොපෙනෙන විමුක්තියක් පතා ආධ්‍යාත්මික ඉගැන්වීම් වලින් උසීගැන්වූ පුහුදුන් අය විඤ්ඤාන මායාවෙන් අසාරත්වය කරාම යන ආකාරය ශාන්ති නායකයාණන් වහන්සේ පෙන්වා වදාලහ. මිනිස් - දෙව් - බඹ සැපයයි කිවූ මිත්‍යා දෘෂ්ඨි බිඳ හෙලා සියලුම සංකල්පයන්ගේ නිස්සාර බව පිලිගත හැකි සාධක මත ගෙන හැර දැක්වූහ.

ලොව පහල වූ පණ්ඩිතයන් යයි කියාගත්
දාර්ශනිකයන් යයි කියාගත්
බුද්ධිමතුන් යයි කියාගත්
ශාස්තෘන් යයි කියාගත් සියලු දෙනාම ඉදිරිපත් කල මතවාද න්‍යායන් - තර්ක

ඇසට පෙනෙන
කණට ඇසෙන
නාසයට දැනෙන
දිවට දැනෙන
කයට දැනෙන
මනට දැනෙන    දෑ යථාර්ථයයි, හෙවත් ඇත්තයයි සත්‍ය යයි කියයි. එහෙත් ශාන්ති නායකයාණන් වහන්සේ අභ්‍යන්තර රූපයේ ප්‍රසාද රූපයට බාහිර රූප සම්බන්ධිකරණයේදී හටගන්නා ස්වභාව ධර්මය 'විඤ්ඤානය' මායාවක් බව දැන වදාලහ. විඤ්ඤාණයේ ඇත්තේ ඤානය මිස ප්‍රඥාව නොවේ.

**කථන්නු බො භන්තේ ජානතො**
**කථං පස්සතො**
**අවිජ්ජා පහීයන්ති?**
**විජ්ජා උප්පජ්ජන්ති?**

භාග්‍යවතුන් වහන්ස,  කෙසේ නම් දන්නා හට ද
කෙසේ නම් දක්නා හට ද

**අවිද්‍යාව කෙසේ නම් ප්‍රහීනවේද?**
**විද්‍යාව කෙසේ නම් උපදීද?**

★ **චක්ඛුං බො භික්ඛවේ භික්ඛු    අනිච්චතො**
**ජානතො**
**පස්සතො**
**අවිජ්ජා    පහීයන්ති**
**විජ්ජා    උප්පජ්ජති**

★රූප :- අනිච්චතො - ජානතො - පස්සතො අවිජ්ජා පහීයති - විජ්ජා උප්පජ්ජති
★චක්ඛු විඤ්ඤානං :- අනිච්චතො - ජානතො - පස්සතො අවිජ්ජා පහීයති - විජ්ජා උප්පජ්ජති
★චක්ඛු සංපස්සං :- අනිච්චතො - ජානතො - පස්සතො අවිජ්ජා පහීයති - විජ්ජා උප්පජ්ජති
★යම්පිදං චක්ඛු සම්පස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං

**සුඛංවා - දුක්ඛංවා අදුක්ඛමසුඛංවා තම්පි**
**අනිච්චතො - ජානතො - පස්සතො**
**අවිජ්ජා පහීයන්ති - විජ්ජා උප්පජ්ජන්ති**

**මහණෙනි, භික්ෂුව**

**ඇස අනිත්‍ය වශයෙන් දනී ද ?**
**ඇස අනිත්‍ය වශයෙන් දකී ද ?**
ඇසෙහි අවිද්‍යාව ප්‍රහීන වේ
ඇසෙහි විද්‍යාව උපදී

**රූපය අනිත්‍ය වශයෙන් දනී ද?**
**රූපය අනිත්‍ය වශයෙන් දකීද ?**

රූපයෙහි අවිද්‍යාව ප්‍රහීන වේ
රූපයෙහි විද්‍යාව උපදී

**චක්ඛු විඤ්ඤාණ ධාතුව අනිත්‍ය වශයෙන් දනී ද ?**
**චක්ඛු විඤ්ඤාණ ධාතුව අනිත්‍ය වශයෙන් දකී ද ?**

චක්ඛු විඤ්ඤාණ ධාතුවේ අවිද්‍යාව ප්‍රහීන වේ.
චක්ඛු විඤ්ඤාණ ධාතුවේ විද්‍යාව උපදී

**ඇසෙහි ස්පර්ශයේ අනිත්‍ය වශයෙන් දනී ද ?**
**ඇසෙහි ස්පර්ශයේ අනිත්‍ය වශයෙන් දකී ද ?**

ඇසෙහි ස්පර්ශයේ අවිද්‍යාව ප්‍රහීන වේ.
ඇසෙහි ස්පර්ශයේ විද්‍යාව උපදී.

★ ඇසේ ස්පර්ශයෙන් උපන් සැප දුක

**උපේක්ෂක වේදනාවන්හි අනිත්‍ය වශයෙන් දනී ද ?**
**උපේක්ෂක වේදනාවන්හි අනිත්‍ය වශයෙන් දකී ද ?**

උපේක්ෂක වේදනාවන්හි අවිද්‍යාව ප්‍රහීනය.
උපේක්ෂක වේදනාවන්හි විද්‍යාව උපදී.
**(අවිජ්ජාප්‍රහාන සූත්‍රය : සං.නි. වේදනා සංඃ අවිජ්ජා වග්ගය)**

මෙසේ චක්ඛු ආයතනය සම්බන්ධව :-

★ ඇස රූපය
★ වර්‍ණ රූපය
★ චක්ඛු විඤ්ඤාන ධාතුව සම්බන්ධව **විද්‍යාව** ඇතිකර ගැනීමටත් අවිද්‍යාව දුරු කර ගැනීමටත් හේතුවන **භාග්‍යවත් දර්ශනය** පැහැදිලි කර දී ඇත. මේ නිසා ඉතිරි ආයතන හෙවත් සෝතායතනය - ඝාණායතනය - ජිව්හායතනය - කායායතනය - මනසායතනය සම්බන්ධ කර ''**ලෝකය වේගයක්**'' බව තහවුරු කරගෙන විදර්ශනා ප්‍රඥාව ඇති කර ගත යුතුය.

පහත දැක්වෙන පරිදි හොඳින් ධාරණය කර **විදර්ශනා භාවනාව** පුහුණු කර ගන්න.

පලමුව ඇස - කණ - නාසය ආදී ඉන්ද්‍රිය සම්බන්ධකරගෙන හිතක් සකස්වන ආකාරය හොඳින් මෙනෙහි කරන්න. '**විදර්ශනා සමාධිය වැඩේවා** !', නැතහොත් '**ලොකෝත්තර සමාධිය වැඩේවා** !' අධිෂ්ඨාන කර භාවනාව ප්‍රගුණ කරන්න. අවසාන අවස්ථාවේදී සමාධියෙන් ප්‍රකෘති සිහියට පැමිණීම සඳහා සමාධිය බසීවා! සමාධිය බසීවා! යි අධිෂ්ඨාන කර සමාධිය බැස ගිය පසු ඇස් අරින්න. පියවි ලෝකයට අවදිවන්න.

# සියළුම ආයජීව්ල ලාභිත්වය සඳහා විදර්ශනා භාවනාව

## ( ඉන්ද්‍රිය භාවනාව - තිලකුණු භාවනාව - අට්ඨාරස ආයතන භාවනාව )

| | |
|---|---|
| ඇස රූපයකි. ධාතු හතරකි. | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඇසෙහි පඨවි ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඇසෙහි ආපෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඇසෙහි තේජෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඇසෙහි වායෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

| | |
|---|---|
| ඇස | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඇසෙහි ප්‍රසාද රූපය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වර්ණ රූප | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| චක්ඛු විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **නාම ධර්මපහ** | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඵස්ස | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| චේතනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනසිකාරය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

| | |
|---|---|
| **බලන සිතේ** | |
| රූපස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඛාර ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| විඤ්ඤාණ ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

| | | |
|---|---|---|
| **බලන සිතේ** රූප, වේදනා, සංඥා, සංකාර සහ විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි | දුකයි අනාත්මයි |
| බලන සිත | අනිත්‍යයි අනිත්‍යයි | දුකයි අනාත්මයි |
| මුලු ලෝකය ම | අනිත්‍යයි අනිත්‍යයි | දුකයි අනාත්මයි |

අනිත්‍ය නම් ගතහැකි දෙයක් නොවේ.
දුක නම් ගතයුතු දෙයක් නොවේ.
අනාත්ම නම් හලයුතු වේ.
නිත්‍ය නොවේ, සැප නොවේ, ආත්මයක් නොවේ.
මම නොවේ.
මගේ නොවේ.
මගේ ආත්මය නොවේ.

| | |
|---|---|
| කණ රූපයකි. ධාතු හතරකි. | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| කණෙහි පඨවි ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| කණෙහි ආපෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යය දුකයි අනාත්මයි |
| කණෙහි තේජෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| කණෙහි වායෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| කණ | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| කණෙහි ප්‍රසාද රූපය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ශබ්ද රූප | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සෝත විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාම ධර්මය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඵස්ස | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| චේතනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනසිකාරය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| අහන සිතේ | |
| රූප ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඛාර ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| විඤ්ඤාණ ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| අහන සිතේ රූප, වේදනා, සංඥා, සංස්කාර සහ විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| අහන සිත | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මුලු ලෝකය ම | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

අනිත්‍ය නම් ගත හැකි දෙයක් නොවේ
දුක නම් ගත යුතු දෙයක් නොවේ

අනාත්ම නම් කල යුතු වේ
නිත්‍ය නොවේ සැප නොවේ ආත්මය නොවේ
මම නොවේ
මගේ නොවේ
මගේ ආත්මය නොවේ

| | |
|---|---|
| නාසය රූපයකි. ධාතු හතරකි. | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසයෙහි පඨවි ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසයෙහි ආපෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසයෙහි තේජෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසයෙහි වායෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාසයේ ප්‍රසාද රූපය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ගන්ධ රූප | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සාණ විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| නාම ධර්ම | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ඵස්ස | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| චේතනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනසිකාර | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ආඝ්‍රාණය කරන සිතේ | |
| රූපස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනාස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඛාර ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| විඤ්ඤාණ ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **ආඝ්‍රාණය කරන සිතේ** | **අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි** |
| රූප වේදනා සංඥා සංකාර | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සහ විඤ්ඤාණය | |
| ආඝ්‍රාණය කරන සිත | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මුලු ලෝකය ම | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

අනිත්‍ය නම් ගත හැකි දෙයක් නොවේ
දුක නම් ගත යුතු දෙයක් නොවේ
අනාත්ම නම් හල යුතුවේ
නිත්‍ය නොවේ සැප නොවේ ආත්ම ය නොවේ
මම නොවේ
මගේ නොවේ

මගේ ආත්මය නොවේ.

| | |
|---|---|
| **කය රූපයකි.** ධාතු හතරකි.<br>කයේ පඨවි ධාතුව<br>කයේ ආපෝ ධාතුව<br>කයේ තේජෝ ධාතුව<br>කයේ වායෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **කය**<br>කයෙහි ප්‍රසාද රූපය<br>ඵොට්ටබ්බ රූප<br>කාය විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි. |
| **නාම ධර්ම**<br>ඵස්ස<br>වේදනා<br>සංඥා<br>චේතනා<br>මනසිකාරය | **අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.**<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි. |
| **පහස ලබන සිතේ**<br>රූපස්කන්ධය<br>වේදනාස්කන්ධය<br>සංඥා ස්කන්ධය<br>සංඛාර ස්කන්ධය<br>විඤ්ඤාණ ස්කන්ධය | <br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි. |
| **පහස ලබන සිතේ**<br>රූප, වේදනා, සංඥා, සංස්කාර<br>සහ විඤ්ඤාණය | <br><br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි. |
| **පහස ලබන සිත**<br>මුලු ලෝකයම | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි.<br>අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි. |

අනිත්‍ය නම් ගත හැකි දෙයක් නොවේ
දුක නම් ගත යුතු දෙයක් නොවේ
අනාත්ම නම් හල යුතු වේ
නිත්‍ය නොවේ සැප නොවේ ආත්මය නොවේ
මම නොවේ
මගේ නොවේ
මගේ ආත්මය නොවේ

| | |
|---|---|
| **මන රූපයකි.** ධාතු හතරකි. | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෝ පඨවි ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෝ ආපෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෝ තේජෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෝ වායෝ ධාතුව | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **මන** | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෙහි ප්‍රසාද රූපය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| ධම්ම රූප | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනෝ විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **නාම ධර්ම** | **අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි** |
| ඵස්ස | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| චේතනා | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මනසිකාරය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **මෙනෙහි කරන සිතේ** | |
| රූපස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| වේදනාස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඥා ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| සංඛාර ස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| විඤ්ඤාණස්කන්ධය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **මෙනෙහි කරන සිතේ** | |
| රූප, වේදනා සංඥා, සංකාර | |
| සහ විඤ්ඤාණය | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| **මෙනෙහි කරන සිත** | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |
| මුලු ලෝකයම | අනිත්‍යයි අනිත්‍යයි දුකයි අනාත්මයි |

අනිත්‍ය නම් ගත හැකි දෙයක් නොවේ
දුක නම් ගත යුතු දෙයක් නොවේ
අනාත්ම නම් හල යුතු වේ
නිත්‍ය නොවේ. සැප නොවේ. ආත්ම නොවේ.
මම නොවේ.
මගේ නොවේ.
මගේ ආත්මය නොවේ.

01. සඤ්ඤෝජන පහාන සූත්‍රය (සංයෝජන ප්‍රහානය පිලිබඳව)

02. සඤ්ඤෝජන සමුග්ඝාත සූත්‍රය (සංයෝජන උපුටාදැමීම පිලිබඳව)

03. ආසවප්පහාන සූත්‍රය (ආශ්‍රව ප්‍රහානය පිලිබඳව)

04. ආසව සමුග්ඝාත සූත්‍රය (ආශ්‍රව උපුටා දැමීම පිලිබඳව)

05. අනුසයප්පහාන සූත්‍රය (යටපත් වූ කෙලෙස් නැවත නූපදන පරිදි නැති කිරීම පිලිබඳව)

06. අනුසය සමුග්ඝාත සූත්‍රය (යටපත් වූ කෙලෙස් නැවත නූපදනා පරිදි මුලින් උපුටා දැමීම පිලිබඳව)

මෙම සූත්‍ර පිලිබඳව කරුණු අධ්‍යයන කර නිවන්මග පහදාගන්න. ලෝකෝත්තර ප්‍රඥාව වඩා වර්ධනය කර සසර දුක නැති කිරීම සඳහා වෙර දරන්න.

## ලෝකයෙන් අත්මිදීමට අනිච්ච සඤ්ඤාව

**අනිච්ච සඤ්ඤා සූත්‍රයේ දේශිත පරිදි,**

★ අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවිතා බහුලීකතා සබ්බං කාමරාගං පරියාදියති.

★ අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවිතා බහුලීකතා සබ්බං රූපරාගං පරියාදියති

★ අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවිතා බහුලීකතා සබ්බං භවරාගං පරියාදියති

★ අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවිතා බහුලීකතා සබ්බං අවිජ්ජං පරියාදියති

★ අනිච්ච සඤ්ඤා භික්ඛවේ භාවිතා බහුලීකතා සබ්බං අස්මිමානං පරියාදියති, සමූහංති

තේරුම:-

★ අනිත්‍ය සංඥාව වැඩීමෙන් බොහෝ කොට වැඩීමෙන් කාම රාගය (රූප රාගය - ශබ්ද රාගය - ගන්ධ රාගය - රස රාගය - පොට්ඨබ්බ රාගය - ධම්ම රාගය) හාත්පසින්ම මැඩලයි. මුලින්ම උපුටා දමයි. විනාශ කරයි. කාම භව ලෝකයන්හි උපතට හේතු වන කාමාවචර කර්‍ම ක්‍ෂය වේ. නැති වේ. හට නොගනී. නිරෝධයට හේතු වේ.

★ අනිත්‍ය සංඥාව වැඩීමෙන් බොහෝ කොට වැඩීමෙන් රූප සංඥා රාගය (රූපී බ්‍රහ්ම ලෝකාගත, අරූපී බ්‍රහ්ම ලෝකාගත ඇල්ම) නැති වේ. මැඩලයි.

මුලින්ම උපුටා දමයි. රූපාවචර බ්‍රහ්ම තලයන්හි හා අරූපාවචර බ්‍රහ්ම තලයන්හි උපතට හේතුවන රූපාවචර කර්ම හා අරූපාවචර කර්ම ක්‍ෂය වේ. නැති වේ. හට නොගනී. භව නිරෝධයට හේතු වේ.

★ අනිත්‍ය සංඥාව වැඩීමෙන් බොහෝ කොට වැඩීමෙන් භවරාගය හෙවත් භවයෙහි නැවත නැවත පැමිණීමට උපතට ඇති ඇල්ම (කාමභව කර්ම, රූප භව කර්ම, අරූපී භව කර්ම) නැතිවේ. මැඩලයි. මුලින්ම උපුටා දමයි.

★ අනිත්‍ය සංඥාව වැඩීමෙන් බොහෝ කොට වැඩීමෙන් අවිද්‍යාව - ලෝකයේ යථාර්ථය නොදැකීම නැති වේ. මැඩලයි. මුලින් උපුටා දමයි.

★ අනිත්‍ය සංඥාව වැඩීමෙන් බොහෝ කොට වැඩීමෙන් අස්මිමානය - මම - මගේ ආත්මය - නියත මිත්‍යා දෘෂ්ටිය (මානය හා එහි දැඩි බව හෙවත් සක්කාය දිට්ඨිය) හාත් පසින් මැඩලයි. මුලින් උපුටා දමයි.

01. **''අනිච්චං ඛයට්ඨේන''** - ක්‍ෂය අර්ථ වශයෙන් ඇතිවීම - නැතිවීම අර්ථයෙන් අනිත්‍ය වේ. වෙනස් වීම ප්‍රඥාවට ගෝචර වීම.

02. **''දුක්ඛං භයට්ඨේන''** - භය උපදවීම අර්ථයෙන් දුක්ඛ වේ. හේතුව ස්ථිර පැවැත්මත් 'නිත්‍යයි' වශයෙන්ම දැඩි මානසිකත්වය කඩා වැටීම නොසිතූ දේ සිදුවීම නිසා ඇතිවන භය ඉපදවීම.

**03.''අනත්තා අසාරට්ඨේන''** - අසාර බව නිසා අනාත්මයි. තම පරිපාලනයට වසඟයට හිතැඟි පරිදි ක්‍රියා නොකිරීම.

★ මේ ධර්ම විවරණය සබ්බාසව සූත්‍රයෙන් **''දස්සනා පහා තබ්බා''** යනුවෙන් සංයෝජන ප්‍රහාණය සමුච්ඡේදනය පැහැදිලි කරති.

★ සීල සූත්‍රයෙහිද **''අනිත්‍ය දුක්ඛ අනාත්ම''** ධර්මතා පංච උපාදානස්කන්ධයට හෙවත් හිත සම්බන්ධව විදසුන් නුවණින් වැඩීමේදී සංයෝජන සමුච්ඡේදනය පැහැදිලි කරති.

★ රතන සූත්‍රයේද **''සහාවස්සන දස්සන සම්පදාය''** යනුවෙන් විදසුන් නුවණින් සංයෝජන සමුච්ඡේදනය පැහැදිලි කරති.

★ ගිරිමානන්ද සූත්‍රයේ දස සංඥා වලින් මුලින් සඳහන් වූ ''අනිච්ච, සංඤාව'' මගින් පංච උපාදානස්කන්ධය '**අනිත්‍ය - දුක්ඛ - අනාත්ම** වශයෙන් වැඩීමට නිර්දේශිතයි.

**''යදනිච්චං තං දුක්ඛං**
**යං දුක්ඛං තදනත්තා**
**තං නේතං මම**
**නේසෝ හමස්මි**
**නමේ සො අත්තානි**
**ඒවමේතං යථා භූතං**
**සම්මප්පඤ්ඤාය දට්ඨබ්බං''**

**(සං.නි.4 අජ්ජත්තානිච්ච සූත්‍රය)**

යමක් අනිත්‍ය නම්, දුක නම්, අනාත්ම නම්. මම කියා හෝ මගේ කියා හෝ මගේ ආත්මය කියා ගත නොහැකි බව ප්‍රඥාවෙන් දැකිය යුතු වේ.

## විසුද්ධි මග්ග ධර්මග්‍රන්ථයේ විස්තර කරන පරිදි

1. **අනිච්චානු විස්සනං භාවෙන්තො - නිච්ච සඤ්ඤං පජහති.**
අනිච්ච සඤ්ඤාව වඩන්නාගේ, නිත්‍ය සඤ්ඤාව දුරු වේ.

2. **දුක්ඛානු පස්සනං භවෙන්තො - සුඛ සඤ්ඤං පජහති.**
දුක්ඛ සඤ්ඤාව වඩන්නාගේ, සැප සඤ්ඤාව දුරු වේ.

3. **අනත්තානු පස්සනං භාවෙන්තො - අත්ත සඤ්ඤා පජහති.**
අනාත්ම සඤ්ඤාව වඩන්නාගේ, ආත්ම සඤ්ඤාව දුරු වේ.

4. **නිබ්බිදානු පස්සනං භාවෙන්තෝ - නන්දිං පජහති.**
නොඇල්මෙහි හෙවත් නොවිඳීම වඩන්නාගේ, සංඛාරයන්ගේ ප්‍රීතිසහගත තෘෂ්ණාව දුරුවේ.

5. **විරාගානු පස්සනං භාවෙන්තො - රාගං පජහති**
පංචකාම ගුණ තෘෂ්ණාව ඇත්වීමෙන් රාගය නැති වේ.

6. **නිරෝධානු පස්සනං භාවෙන්තෝ - සමුදයං පජහති.**
නිරෝධය වඩන්නාගේ සමුදය නැති වේ.

7. **පටිනිස්සග්ගානු පස්සනං භාවෙන්තො - ආදානං පජහති.**
සංස්කාරයන්ගේ අත්හැරීම දුරුකරන්නාගේ අල්ලාගැනීම (ග්‍රහණය) දුරු වේ.

ලෝකයේ යථාර්ථය නුවණැසින් නොදකින ධර්මය නොඅසන අස්සුතවත් පෘතජ්ජනයා සිත උපාදානය කර දුක් රැසකට මුල පුරයි. හේතුව ? හටගත් සියල්ල

**''අනිච්චේ නිච්ච සඤ්ඤා - අනිත්‍ය දේ නිත්‍ය වශයෙන්ද**
**දුක්ඛේ සුඛ සඤ්ඤා - දුක් දේ සැප වශයෙන්ද**
**අසුභේ සුභ සඤ්ඤා - අසුභ දේ සුභ වශයෙන්ද**
**අනත්තේ අත්ත සඤ්ඤා - අනාත්ම දේ ආත්ම වශයෙන්ද**
දැකීම නිසාය.

★ මෙසේ බැවින්, ලෝකයා නිත්‍ය කියන දේ ආයර්‍ය උතුමෝ අනිත්‍ය වශයෙන් දකී.

★ ලෝකයා සැප කියන දේ ආයර්‍ය උතුමෝ දුක් වශයෙන් දකී.

★ ලෝකයා සුභයයි කියන දේ ආයර්‍ය උතුමෝ අසුභ වශයෙන් දකි.

★ ලෝකයා ආත්මයි කියන දේ ආයර්‍ය උතුමෝ අනාත්ම වශයෙන් දකී.

ඒ ස්වභාවය ශාන්ති නායකයාණන් වහන්සේ මෙසේ පහදා දෙයි.

**''ඉධ භික්ඛවේ භික්ඛු''**
මහණෙනි. මේ සාසනයේ මහණ තෙමේ,

**''රූපං අභිනන්‍දති''**
රූපයෙහි සතුටු වෙයි - මැනවැයි සිතයි.

**''අභිවදති''**
රූපයෙහි සතුටු බව ප්‍රකාශ කරයි.

**''අජ්ඣොසාය තිට්ඨති''**
රූපයෙහි බලවත්ව ඇල්මෙන් ගිලගත් බවෙහි සිටියි.

**''තස්ස රූපං''**
ඒ රූපයෙහි

**''අභිනන්දිතො''**
මැනවැයි සතුටු වෙමින් සිටින්නේ නම්,

**''අභිවදතො''**
සතුටෙන් ප්‍රකාශ කරමින් බලවත් වූ ඇල්මෙන් වෙසේ නම්,

**''අජ්ඣොසාය තිට්ඨිතො''**
ගිලගත් බවෙහි සිටී නම්,

**''උප්පජ්ජති නන්දි''**
ඒ නිසා ඔහුට තෘෂ්ණාව උපදී.

**''යා රූපෙ''**
ඒ රූපයේ

| | |
|---|---|
| **''නන්දි''** | - තෘෂ්ණාව උපදී . |
| **තදුපාදානං** | - එය උපාදානය වේ. |
| **තස්සුපාදානපච්චයා** | - රූපයේ උපාදානය නිසා |
| **භවො** | - භවය වේ. |
| **භව පච්චයා ජාති** | - භවය නිසා ජාතිය වේ. |
| **මරණං** | - මරණය වේ. |
| **සෝක** | - සෝකය වේ. |
| **පරිදේව** | -බොහෝ සේ වැලපීමට හේතු වේ. |
| **දුක්ඛ** | - කායික දුක් වේ. |

**දෝමනස්සුපායාසා සම්භවන්ති** - මානසික - චෛතසික දෝමනස්ස උපායාසය වේ.
**ඒවමේතස්ස කේවලස්ස දුක්ඛන්ධස්ස සමුදයෝ හෝති** - මෙසේ හුදෙක්ම දුක් සමූහයකම හටගැනීම වේ.

ඉහත ආකාරයටම ඉතිරි වේදනා - සඤ්ඤා - සංකාර - විඤ්ඤානය - පංච උපාදානස්කන්ධය හෙවත් උපාදාන සිත භවයට යන බව (නිත්‍යයි-සැපයි ආත්මයි වශයෙන් ගැනීම නිසා) සිදුවන බව පැහැදිලිය.

**රූප**
**වේදනා**
**සංඥා**
**සංඛාර**
**විඤ්ඤාණ**

★ අභිනන්දති = සතුටු වේ. මැනවැයි සිතයි.
★ අභිවදති = සතුටු වේ. සතුටු වූ බව ප්‍රකාශ කරයි.
★ අජ්ඣොසාය තිට්ඨති = බලවත්ව ඇල්මෙන්ම කිඳා බැස ගිලගෙන සිටී.
★ අභිනන්දිතො = සතුටු වෙමින්
★ අභිවදතො = සතුටේ සතුට ප්‍රකාශ කරමින්
★ අජ්ඣොසාය තිට්ඨතො = බලවත් වූ ඇල්මෙන්
★ උප්පජ්ජති නන්දි = කිඳා බැස සිටීම නිසා තණ්හාව උපදී.

ඉහත ආකාරයෙන් පංච උපාදානස්කන්ධයම වෙන වෙනම විස්තර වී ඇත.

මේ ධර්මතාවය පෙරලා **භව නිරෝධය** සඳහා පාදක වන අයුරු ඉතා පැහැදිලිව දේශිතය.

**ඉධ භික්ඛවේ භික්ඛු** :- මහණෙනි, මේ සාසනයේ මහණ,

**රූපං නාභිනන්දති** :- රූපයේ සතුටු නොවේ. මැනවැයි නොසිතේ.

**නාභිවදති** :- රූපයේ මැනවැයි සතුටක් ප්‍රකාශ නොකරයි.

**නාජ්ඣෝසාය තිට්ඨති** :- බලවත් වූ ඇල්මෙහි එල්බගත් බවෙහි නොපිහිටයි.

**තස්ස රූපං** :- ඒ නිසා ඒ රූපයේ

**අනභිනන්දිතො** :- නොපතයි. සතුටක් නොපැනවේ.

**අනජ්ඣෝසාය තිට්ඨතොයා** :- බලවත් වූ ඇල්මෙන් එල්බගත් බවෙන්, ගිලගත් බවෙන් නොපිහිටී

**නන්දි සා නිරුජ්ඣති** :-නිසාම රූපයේ තෘෂ්ණාව නූපදී.

## තීරණාත්මක නික්මීමක් සඳහා

ඇසට නිරීක්ෂණය වන වර්ණ රූපය - කණට නිරීක්ෂණය වන ශබ්ද රූපය - නාසයට නිරීක්ෂණය වන ගන්ධ රූපය - දිවට නිරීක්ෂණය වන රස රූපය - කයට නිරීක්ෂණය වන පොට්ඨබ්බ රූපය - මනට නිරීක්ෂණය වන ධම්ම රූප - මේ අභ්‍යන්තර බාහිර රූප සංකත වේ. සකස්වීම්ය - භෞතිකයි. රූප විභජනය කර බෙදා වෙන්කර යාමේදී ''ශක්ති '' ප්‍රභවයක් බව විදු ඇසට - පැණැසට විද්‍යාමාන වේ. එහි ඒකීය භාවයක් ඒකාත්මීය බවක් කිසිසේත් ප්‍රකට නොවේ. පැනවිය ද නොහැක. ස්පුධ කල නොහැක. ඒ පටිච්ච සමුප්පන්න ධර්මතාවයක් පමණි. ස්වයංභූ වෙනස් වීමකි. එහි යථාභූත භාවය නම් ප්‍රකට බවේ ශූන්‍යතාවය අප්‍රකට වීමයි. අප්‍රකට බවේ ශූන්‍යතාවය ප්‍රකට බවයි. මෙම සඳහන් කිරීම වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ''එහි ස්වභාවය'' ගැන යම් ඉඟියක් පැනවීමට, ඒත්තු ගැන්වීම සඳහා පමණි. අන්‍යොන්‍ය විපරිනාම ධර්මතාවය පාරිභාෂිත වචනයෙන් ප්‍රකාශකළ නොහැකි නිසාවෙනි. එම ධර්මතාවය ඉඳුරන්ට ගෝචර නොවේ. විඤ්ඤානයට ගෝචර නොවේ. ස්කන්ධ විරහිත භාවය බුද්ධියට ගෝචර කර ගත යුතුය. ප්‍රඥාවෙන් දැකිය යුතුය. ශුද්ධ ධර්මවල ඒකීයත්වයක් නොමැත. වහ වහා වෙනස්වන ධර්මතාවයකි. ධාතුන්හි පරම + අනුවක පරමානුවක

කෝටිප්‍රකෝටි ගණනක ප්‍රමාණයක් වෙනස්වීම මත ''ස්ථිතියක්'' හෙවත් ''ඇත'' පැනවිය නොහැක. ''ඇත'' නැති තැන ''නැත'' ද නැත.

අනිත්‍ය තාවය හෙවත් වේගය පිළිබඳව බුද්ධිමය දැනුමටත් වඩා ඊට එහා ගිය (සත්‍යඥාණය කෘත්‍ය ඥාණය - කෘතඥාණය) අත් දැකීමක් අත්‍යවශ්‍යයයි. සවිඥානක අවිඥානක සංකතයන්ගේ මේ ක්‍රියාවලිය අතරක් නැතිව නොකඩවා සිදුවන ස්වභාව ධර්මතාවක් බව ''සතිමත්'' ව විමසිය යුතුය. එය අප්‍රමාදී බවය. සතිමත් බවයි. එලඹ සිටි සිහියයි. යෝනිසෝ මනිසිකාරයයි. **අනවබෝධය මත ''සංකත'' ධර්මයන්ට ප්‍රතික්‍රියා දක්වීම නිසා ''සංඛාර'' හටගැනීම වැලැක්විය නොහැක.** සෑම රූප කලාපයක්ම පරම අනු වලට විභජනය වීමේදී මූල ද්‍රව්‍ය 8 ක් ප්‍රකට වන බව දක්වේ. එනම් පඨවි ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා - වේ. පළමු හතර කැපී පෙනේ. ඉතිරි හතර ඇති නමුත් අපහැදිලිය. මේවා ශුද්ධාෂ්ඨක කලාප නම් වේ. එක් කලාපයක ප්‍රමාණය වනුයේ අති සියුම් දූවිලි අංශුවකින් හෙවත් ඒකකයකින් 1/46656 පමණ වේයයි විද්‍යාත්මක ගණනය කර ඇත. (විද්‍යාත්මක සාධක ස්ථිර නිගමන නොවන අතර යම්කිසි වෙනස්වීමක අදහසක් ගත හැක.) එයද වහා වෙනස් වේ. අසුරු ගහණ මොහොතක කලාපයන්ගේ

වෙනස්වීම ට්‍රිලියන 10 x 12 වාරයක් බව කියවේ.

සම්මුති දේශනාවේදී ''රූපය'' ප්‍රකටවන බව පැහැදිලි කරන නමුත් පරමාර්ථ දේශනාවේදී පෙන්නුම් කරන්න දෙයක් නැත. එනම් සම්මුති ව්‍යවහාරයේ ''රූපය'' යනු මුසාවකි. බොරුවකි. මේ ලොකොත්තර ධර්මතාවයයි.

ශාන්ති නායක දර්ශනය සංකල්පය ඉක්මවා ගිය අති ප්‍රබල ධර්මතාවයකි. එසේ හෙයින් ''යො පටිච්ච සමුප්පාදං පස්සති - සො ධම්මං පස්සති'' යනුවෙන් වදාලහ. සංඥා විරහිත අනිමිත්තය ''බුද්ධ'' නම් වේ. තථාගත ධර්මයේ පරමාර්ථ දේශනා, සම්මුති දේශනා දෙකොටසෙ වෙනස යෝගාවචරයා බුද්ධියෙන් අවබෝධ කටයුතුය. ඇතිවීම නැතිවීම - සමුදය වය - ධර්මතා පැනවීම වශයෙන් - ප්‍රඥප්ති වශයෙන් - ප්‍රවෘත්ති වශයෙන් - හුවා දක්වීම් වශයෙන් - ගෙන හැර දක්වීම් වශයෙන් - ආඥා දේශනා වශයෙන් - දක්වීම් ලෝකොත්තර සම්මාදිට්ඨියේදි ඉවත් වේ.

සංකත ධර්ම වල උපත පැනවිය නොහැක. '' ප්‍රවර්තනය '' හෙවත් ''පැවැත්ම '' යන වචන යෙදේ. '' උපත '' නැති තැන ''විපත'' නැත. ''ඇත'' හෝ ''නැත'' නූපදි. ''ඇත'' නැතිනම් ''නැත '' නැත. ලෝක ධර්මයන්ගේ සංකතයන්ගේ යථාර්ථය - මූලය - ස්වකීය ලක්‍ෂණය - යථාභූත භාවය - අඛන්ඩව අතරක් නැතිව වූ ''පටිච්ච සමුප්පන්න '' භාවයයි.

සිතුවිලි වශයෙන් - සංකල්ප වශයෙන් - පනවා ගැනීම් වශයෙන් සංඥා වශයෙන් - ලොකොත්තර

ධර්මතාවයේ ප්‍රකට බවක් නොවේ. ඒ අසංකත ධර්මයේ ස්වභාවයයි.

ආයර්‍ය පර්යේෂණ චාරිකාවේදී බුද්ධත්ව ගවේෂණයේදී ගෞතම බෝසතාණන් වහන්සේ මුළු මහත් දඹදිව සිසාරා දර්ශනවාද මතවාද න්‍යාය ධර්ම ඉදිරිපත් කල ශ්‍රමණ බ්‍රාහ්මණ නිඝණ්ඨ පරිබ්‍රාජක ජටිල තවුසන් වෙත එළඹ එම ඉදිරිපත් කිරීම වල සත්‍යතාවය හා අසත්‍යතාවය ප්‍රඥාගෝචරව විමසා බැලූහ. ඒ ඒ සම්ප්‍රදායන්ගේ භාවනා ක්‍රම මගින් ව්‍රත මගින් යාග හෝම මගින් ආමිෂ වශයෙන් කාම සංඥා රූප සංඥා අරූප සංඥා සහිත ලෝක ධාතුන්හි සැරිසැරීමක් පමණක් බව වටහාගත්හ. එම පිළිපැදීම් භව නිරෝධය සඳහා පිටිවහලක් නොවීය. ඒ දෘෂ්ටි ජාලයෙන් මිදීම ''නිවන'' බව අවබෝධ කරගත්හ. ( සියලුම දෘෂ්ටි වලින් මනස නිදහස් කරගත යුතුය. )

**ඒ තීරණාත්මක නික්මයාමේ අභිනිෂ්ක්‍රමණයේ සම්ප්‍රාප්තිය බුද්ධගයාවයි. එය අවිජහිත සුද්ධ බුද්ධ භූමියයි.**

ගෞතම ශාක්‍ය සිංහ මුනීන්ද්‍රයාණන් වහන්සේ නිරෝධ සමාපත්තියට සමවැදීම - අමනසිකාරය ආදි වශයෙන් ප්‍රකට කලේ උපදේශාත්මකව අනුදැන වදාලේ මහා නිහඬ භාවයට සම්ප්‍රාප්ත වීමටයි. '' **යථා එකෝ තථා බ්‍රහ්ම** '' තනිවීම බ්‍රහ්මත්වයයි. මානසික නිහඬ බවයි. විතක්ක විප්පාර - විචාර විප්පාර හට නොගැනීමයි. සිතුවිල්ලක් හට ගැනීමට පළමුව '' අරමුණ '' තිබිය යුතුය. අරමුණ යනු

රූපයකි. රූපාරම්මන , ශබ්දාරම්මන , ගන්ධාරම්මන , රසාරම්මන, පොට්ඨබ්බාරම්මන ,ධම්මාරම්මනය, එයිනුත් ධම්ම රූපය මන රූපයට ඵස්ස වීම පළමුව සිදුවේ. ඵස්සය නිරෝධයේ දී සිදුවන්නේ බාහිර අභ්‍යන්තර රූප සම්බන්ධීකරණය නොවීමයි. අරහත් ඵල සමාපත්තිය නිරෝධ සම්පත්තිය සමවදින අවස්ථාවයි. උත්තම නිහඬ බවයි. සිතුවිල්ලෙන් තොරව වාසය කිරීමයි. මනසින් නික්මයාමයි.

උත්පත්ති - මරණ - මම - අපි - සතා පුද්ගලයා - ග්‍රහවස්තු - කාමභව - රූප භව - අරූප භව - පාදක කරගෙන දේශනා ප්‍රඥප්ති නමින් හඳුන්වයි. පරමාර්ථ දේශනා නොවේ. යථාභූත ඤාණය යනු උත්පත්ති මරණ ඉක්මවා ගියාවූ ද , සම්මුතිය ඉක්මවා ගියාවූ ද භෞතිකත්වයක් ඉක්මවා ගියා වූ ද, පැන වීමක් ප්‍රකට කිරීමක් කිසිසේත් පෙන්විය නොහැකි '' අස්ථි ත් '' නොවන '' නස්ථිත් '' නොවන විඤ්ඤාන - නාම - රූප යන්ගේ පැනවීමක් ප්‍රකට කිරීමක් හුවා දැක්වීමක් ගෙනහැර දැක්වීමක් නොයෙදෙන පටිච්ච සමුප්පන්නයේ යථාර්ථයයි. ''ඇති'' බවත් ''නැති '' බවත් නැති දෙකක ක්ෂයවීමය. (දු + ඛ = දුක්ඛ = ''ඇත'' ''නැත'' - නැතිබව ) අනිත්‍යයි. විතක්ක විචාර වශයෙන් ගෙන මනසිකාරයෙන් තොර පැනවීමක් නැති අති පරිසුද්ධ නිහඬ බවකි. භෙවත් චිත්ත පරම්පරාවක් නොමැති බවයි. ''අනිදස්සන විඤ්ඤාණය'' යනු මේ තත්වයයි. මොනම ආකාරයෙන්වත් චින්තනාත්මක වින්දනයක් නොමැති බවයි. මමෙක් කෙනෙක් දෙයක් පැනවීමක් සීමාමායිම් නොමැති පඨවි , ආපෝ , තේජෝ , වායෝ , ආකාශ , විඤ්ඤාණ , ශුද්ධ ධර්මතා වශයෙන් කලු සුදු

වශයෙන් වත් අඳුරු ආලෝක වශයෙන්වත් ප්‍රකට කිරීමක් නොමැති සංකතයක් ''නොවන '' අසංකතයක් පමණි. එය වචනවලින් ප්‍රකාශ නොවන නිසා අව්‍යාකෘතයි. අතක්කාවචරයි. කර්තෘ විරහිත මනෝ භාවයකි. ඔබේ හුස්ම විශ්වයට මුදා හැරියා හා සමානයි. මහා සාගරයට අහසින් වැටුණු වැහි බිඳු වලට උනදෙයක් පෙන්විය නොහැක. සම්පූර්ණයෙන්ම කිසිත් ඉතිරිවී නැති දියවී , නොපෙනී ගිය මහා නිහඬ බවක් පමණි. පහනක් නිවී ගියා සේය. භෞතික ලෝකයේ පෙනෙන - දැනෙන - විදින ආයතන වලට සම්බන්ධවන සියලු දෑ සඳහා සංඥා ලකුණු ඉදිරිපත් කිරීමට ව්‍යවහාර භාෂා සහ මුද්‍රා ඇත. අකුරු සමූහයකින් වචන සමූහක් සෑදී ඇත. තනි අකුරකින්ද සංඥාවක් අදහසක් ප්‍රකට කළ හැක. එහෙත් ලොකොත්තර ස්වභාවය ඉක්මවා ගියා වූ අනුත්තර ධර්මතාවය මානසික ග්‍රහණයකර ප්‍රකට කිරීම සඳහා කොතරම් ප්‍රාණ පිහිටුවා සජීවිකත්වය ආරෝපණය කළත් කිසිම භාෂාවකට මාධ්‍යයකට මේ උත්තරීතර ලෝකෝත්තර තත්වය ප්‍රකට කළ නොහැක. උත්තම නිහඬ බව නිදහස් බව ප්‍රකට කිරීමේදී සියලු භාෂා මාධ්‍ය මළ භාෂාවන් වේ. ඒ පරිපූර්ණ උත්තම නිදහසයි.

එක් වස්තුවක් ද්‍රව්‍යයක් ගෙයක් දොරක් ගලක් පුද්ගලයෙක් සතෙක් දෙවියෙක් ප්‍රඥප්ති පඨවි ආපෝ, තේජෝ වායෝ හා විඤ්ඤාන යන ධාතුන්ගේ අඩු වැඩි බවක් ප්‍රධාන අප්‍රධාන බවක් සාපේක්ෂව විශ්ලේෂණය කර බැලීමේදී පෙනීයයි. ඊට එහා ගිය සුවිශේෂී බවක් දක්නට නොමැත.

මූලිකම සිද්ධාන්තය වන්නේ මේ සුද්ධ ධර්මයන්ගේ ඉදප්පච්චය තාවය හෙවත් පටිච්ච සමුප්පන්න භාවය මත වූ ශූන්‍යතා දර්ශනයයි. විශ්වය තුළ විද්‍යාමාන වන්නාවූ අංශු ශක්ති , (ශුද්ධ ධර්ම ) සාමුහිකව පූංජයක් වශයෙන් ගොනුවක් වශයෙන් පනවාගෙන සම්මුති වශයෙන් නාම යෙදේ. තථාගත දර්ශනයේ ඒ සමස්තයම පංච උපානස්කන්ධ (ලෝකය ) වශයෙන් නාමිකව ඉදිරිපත් කෙරේ. මෙහි ඇත්ත ඇති සැටියෙන් ශක්තින්ගේ මූල ස්භාවය විනිවිද හෙවත් විදර්ශනා වේදී යථාභූතය පිළිබඳව යථාවත්ව අවබෝධ වේ. එහිදි කිසිවක් ඇත්තේත් නැති නැත්තේත් නැති අස්ථි - නස්ථි නොවන ශූන්‍යතා දර්ශනය බුද්ධියට ගෝචරවීමේදී නිදහස නිවීම සිදුවේ. එය සම්මාඥාණ - සම්මා විමුක්ති නමින් අංග දහයකින් සමන්විත අර්හත් ඵලයේ සම්මා සමාධියට පසුව ඇතිවන ධර්මතාවයි. විශ්වය ධර්මතාවල යම් හටගැනීමක් විද්‍යාමාන වන්නේ නම් එය ශූන්‍යතා ධර්මතාවයට යටත්ය. එය ශාස්වත උච්ඡේද යන අන්ත දෙකට කිසිසේත් සම්බන්ධ නැති **''දිට්ඨින්ච අනුපගම්ම'' සම්මා ඥාණ සම්මා විමුක්තිය වේ.** ඒ නිසා ශූන්‍යත්වය යනු කිසියම් හටගත් වස්තුවක ඇතුලාන්තයේ පෙනෙන බව හෝ නොපෙනෙන බව ප්‍රකට කිරීමට යෙදෙන යෙදීමක් නොවේ. එය අව්‍යාකෘතයි. පාරිභාෂිත ශබ්ද මාලාවට අන්තර්ගතයක් නැති මහා ප්‍රඥාව නම්වූ බුද්ධමය ශුද්ධ මානසික තත්වයක් මිස ඊට එහාගිය තත්වයක් බව කිසිසේත් ප්‍රකාශ කළ නොහැක. දුෂ්ටි ගත වාදයක් නොවේ. අඥ්ඥාතයි. සියලුම දෘෂ්ටීන්ගේ සමූලඝාතනයයි. ශූන්‍යතා දෘෂ්ටියත් ශේෂ නොවී

ඉක්මයාමකි. නැතිවීමකි. නැතහොත් ශූන්‍යතාවය ද ශූන්‍යවීමකි.

අයෝනිසො මනසිකාර යනු ඇත්ත ඇති සැටියෙන් නොදැකීමයි. හෙවත් වැරදි දැකීම , මිත්‍යා දෘෂ්ටියයි. යෝනිසො මනසිකාර ඇත්ත ඇති සැටියෙන් දැකීම , හරි දැකීමයි. භෞතිකත්වය ඉක්මවා ගියාවූ ලෝකෝත්තර සිතට විදර්ශනය වන ශුද්ධ මානසික තත්වය ශූන්‍යත්වයයි. දෘෂ්ටි පාරිශුද්ධත්වය ශූන්‍යත්වයයි. '' **සුඤ්ඤත විමොක්ඛය** '' **යි** '' **ඵස්ස නිරෝධයයි** '' මානසික චින්තන රටාවේ රූපමය සංඥා නිරුද්ධ වීමයි. ධාතුන්ගේ ස්වභාවය යථාභූත ඥාණ දර්ශනයට විදර්ශනය වීමේදී වේගය දැකි. ඇතිවීම නැතිවීම දෙකම ''ඛය'' බවට පත්වන විට '' **අමනසිකාර** '' නිසා විඤ්ඤානයාගේ පැවැත්මක් නැත. ඵස්සය නිරුද්ධ වීමෙන් විඤ්ඤානයාගේ නිරුද්ධ වීම සිදුවේ. නිවැරදි දැක්ම හෙවත් ''**සම්මා දිට්ඨිය** '' යනු ලොකෝත්තර තත්වයකි. එහි දිට්ඨිමය ප්‍රභවයක් නොමැත. **මැදුම් පිලිවෙත වූ අනත්දෙකට නොයාම වූ ''අමනසිකාරය '' නම් වූ මෙනෙහි නොවීමක් නොකිරීමක් තුළ නිවැරදි දෘෂ්ටියක් ද තිබිය නොහැක.** එය ශූන්‍යත්වය නම් වේ. නිවැරදි දැක්ම තුළ සම්මා දිට්ඨිය තුළ පනවා ගැනීම නැති නිගමනයකට නොඑළඹි පත්නොවූ '' **බුද්ධ මනසයි.** '' සියල්ල ශූන්‍යයි. ආත්ම වාදය - දිට්ඨි දෙදරා සුණු විසුණු වී යාමකි. ශාක්‍ය මුනින්ද්‍ර ස්වාක්ඛාත ධර්මයේ '' **සබ්බ නිමිත්තං අමනසිකරොන්තො** '' යනුවෙන් මහා සුඤ්ඤතා සූත්‍රයෙන් ප්‍රකට කරන්නේ මේ ධර්මතාවයයි. ලෝක

ධර්මයන් යනු පනවා ගැනීම් පමණි.

- ★ මනසින් නික්මයාම ප්‍රඥාව අවධි විමයි.
- ★ වර්ණ රූපය අත්හරින්න.
- ★ ශබ්දය අත්හරින්න.
- ★ ගන්ධය අත්හරින්න.
- ★ රස අත්හරින්න.
- ★ පොට්ඨබ්බය අත්හරින්න.
- ★ ධම්ම රූප අත්හරින්න.
- ★ සිත අත්හරින්න
- ★ කර්ම වාදය අත්හරින්න.
- ★ මම අත්හරින්න
- ★ මනසින් නික්මෙන්න.

**එවිට , ලෝකයෙන් එතර වේ.**

සියලුම සංඛාරයන්ගේ මූල ශක්ති වූ රාග - ද්වේෂ - මෝහ හා අලෝභ , අදෝෂ , අමෝහ මුලින් උපුටා දමූ බුද්ධාදි රහත් උතුමන් තමන් වහන්සේලා සම්ප්‍රාප්තවූ ක්ෂෙම භූමියෙහි සිට පුනරාවලෝකනය කර බැලීමේදී පුද්ගලයා සතා මම වශයෙන් කාල මැනීම සිද්ධි සිද්ධාන්ත විඥ්ඥාන නාම රූප වශයෙන් පනවාගෙන පවත්වාගෙන ආ ධර්මතා හිස් බවක් දකිති. ''නැති'' දෙයක් ''ඇති '' නම් වූ මනසිකාරයෙන් මිදෙති. අමනසිකාරය නම් වු මිදිම නම්වූ අචින්ත්‍ය තුළමයි. ''බුද්ධ මනස'' අක්‍රියව පවතින්නේ. එයයි පරිශුද්ධ සිතක යථාර්තය වන්නේ. ඒ අමනසිකාරයයි. පුද්ගල මානසිකත්වයක් එහි නොමැත.

'' මම ශාන්ත වෙමි ''

'' මම නිදුක් වෙමි ''

'' මම නිවන් දකිමි '' යනුවෙන් එහි ප්‍රකාශ පැතුම් , පනවා ගැනීම් නැත. ''මම'' නැති තැන ශාන්ත බව - නිදුක් බව - නිවන පනවා ගැනීම් කිසිසේත් ප්‍රකට කළ නොහැක. ලෝක ධර්‍මයන් යනු විශ්ව ශක්ති සමූහයකි. '' ඇති '' බවත් නැති වෙන ''නැති '' බවත් නැති වෙන ස්වභාවයකි. මේ විශ්ව සාධාරණ ධර්‍මතාවය පුහුදුන් මනසට ගෝචර නොවීමයි. ඉලක්ක නොවීමයි , ගැටලුව එනිසාම පදනමක් වස්තුවක් තැනක් කිසිත් නැති තැන හෙවත් ශූන්‍යත්වය තුළ සිතුවිල්ලක් පැනවිය නොහැක. මේ ස්වභාවය යථාර්ථය යථාවත්ව බුද්ධියට ගෝචර වීමෙදි සිතෙන් නිදහස් වීම - මනෝ ක්‍රියාකාරිත්වයෙන් නිදහස් වීම සියලුම නිවීම් වලට ශාන්ත පදයට හේතු කාරක වේ.

''පිනත් '' නැති ''පවත් '' නැති (පුඤ්ඤපාප පහීනස්ස) කර්‍ම කිසිත් නැති ''බුද්ධ '' හෙවත් අර්හත් ඵල සිත කර්‍ම සිතුවිල්ලෙන් තොරය. විඤ්ඤාන - නාම - රූපයාගේ ක්‍රියා ස්වභාවයකි. එසේ හෙයින් ''අර්හත් '' ඵලය සිතුවිල්ලක් වශයෙන් ප්‍රකට කිරිම පදනම් විරහිතය. ඵලසිතක ''උත්පත්ති '' නම් වූ පදය නොයෙදේ.

විඤ්ඤානයේ ක්‍රියාකාරිත්වය මන ක්‍රියාත්මක භාවයට පාදක වේ. **පුහුදුන් අයගේ ස්වභාවය විඤ්ඤානයෙන් අවධි වී ක්‍රියාත්මක භාවයයි. ඤාණයෙන් අවධි වී සිටීම යනු විඤ්ඤානවත්**

නොවීමයි. හෙවත් ඵස්ස නිරෝධයයි. භෞතික වස්තු සම්බන්ධයෙන් සම්මුති පනවා ගැනීම ( ගස - කොළ - මල් - ගෙඩි - හරකා - මිනිහා යනු සම්මුති වේ.) ඒ විඤ්ඤානයේ අවධිවීමයි. එහි ඇත්තේ අයෝනිසෝ මනසිකාරයයි. ඤාණයෙන් අවධි වීම යනු ධාතුන්ගේ ස්වභාවය ''වේගයත්'' වශයෙන් දැකීමයි. එහිදී විඤ්ඤානයේ හට ගැනීමක් ප්‍රකට කළ නොහැක. ''ඵස්ස'' නිරෝධයෙන් විඤ්ඤානය නිරුද්ධ වන බැවින් මම නැති තැන කරන්නෙක් පැනවිය නොහැක. කරන්නෙක් නැති තැන ක්‍රියාත්මක භාවය මිස කම් නැත. විදසුන් නුවනින් විශ්ව පදාර්ථයන්ගේ ශක්ති සමූහයේ යථා භූත භාවය හෙවත් ඇත්ත ඇති සැටියෙන් දැකීම දර්ශන සම්පත්තියයි. එහිදී පෙරකී පරිදි මම අපි, ගස් කොළන් , සතා සිවුපාවා යනුවෙන් සම්මත පනවා ගැනීම් නැත.

- ධාතුන්ගේ ශක්තින්ගේ එකතු කිරීම ''සම්මුතියයි '' එය අවිද්‍යාවයි.

- ධාතුන්ගේ ශක්තීන්ගේ විසුරුවා හැරීම ''පරමාර්ථයයි'' එය විද්‍යාවයි.

- විඤ්ඤානයෙන් අවධි වීම පුහුදුන් ස්වභාවයයි.

- ඤාණයෙන් (ප්‍රඥාවෙන් ) අවධි වීම රහතුන්ගේ ස්වභාවයයි.

විශ්වය තුළ සදාකාලික ප්‍රවර්ථන වෙමින් පවතින විශ්ව ශක්ති පරමානු ශක්ති , ඉලෙක්ට්‍රොනික

ශක්ති , ධාතු - සුද්ධ කලාප , පුංජම වශයෙන් - ගොනුවක් වශයෙන් - සමූහයක් වශයෙන් - කැටිය වශයෙන් - පිඬුවක් වශයෙන් - ඝනීභූතව ප්‍රකටවීම ස්වභාවය ඇත්ත ඇති සැටියෙන් දැකීම සිදුවිය යුතුය. මේ ගොනුවට - කැටියට පුංචියට - ''මම'' යනුවෙන් පනවා ගැනීම අමනොඥ ක්‍රියාව මුලාවකි. එතැනයි අවිද්‍යාව


භාෂා මාධ්‍යයක ඇති ඉතාමත් නොවටිනා වචනය ''මම'' යන්නයි. ''මම'' මානසිකත්වයෙන් මිදීම , නික්මයාමමයි අර්හත් ඵලය වන්නේ එතන පිං පවු නැත. එසේ නම් එහි ඇත්තේ ස්වභාව ධර්‍මයාගේ ක්‍රියාකාරිතවයක් පමණි. ක්‍රියාවක් විපාක වාරයක් කරා නොයයි. ''භවය'' හට ගැනීමට සාධක නොමැත.

පඨවි - ආපෝ ආදී ''ධාතු'' හයට හෙවත් ''සුද්ධධර්‍ම'' හයට ''ශක්තිය'' කෙසේ නම් ලැබුනේද? කෙසේ නම් ශක්තිය ජනිත වූයේද යන්න විද්‍යානුකූලව හා ධර්‍මානුකූලව පිලිගත හැකි සාධාරණ හේතු පදනම් කරගෙන අවබෝධ කටයුතුය. සම්බුද්ධ දේශනාවේ සඳහන් වන්නේ සම්මුති ලෝක නිරුක්තියේ හෙවත් හට ගැනීමේ මූල ධර්‍ම ''**සුද්ධ ධම්මා පවත්තන්ති**'' යනුවෙනි. මේ ''**සුද්ධ ධම්මා**'' යනු ඉහත සඳහන් ධාතු හයයි. ''**පවත්තන්ති**'' යනු ප්‍රවර්තනය වීමයි හෙවත් පරිවර්තන ශීලි ස්වභාවයයි. ප්‍රබලවම වේගවත් වීමයි. කිසිම ලෙසකින් ගණනකින් සංඛ්‍යාත්මකව මැනිය නොහැකි වේගයකින් වහා වෙනස් වන ස්වභාවයයි. ඒ ධාතුවලටය ආවේනික වු මූල ස්වභාවයයි. ධාතු යනු ''ධණ'' හා

''සෘණ'' අතර නිරන්තර ශාපේක්ෂතා වේගවත්වීමකි. ප්‍රවේගයකි. ''ධණ'' හෙවත් ''ඇත'' ක්ෂයවීම නම් වු නැති වීම. ''සෘණ'' හෙවත් ''නැත'' ක්ෂයවීම නම් වු නැතිවීමයි. එනම් ඇතත් නැතිවේ. නැතත් නැති වේ. ඉහත කී ශක්තීන්ගේ ධාතුන්ගේ හෙවත් ශුද්ධ ධර්‍මයන් හි ස්වභාවයෙන්ම හෙවත් ප්‍රකෘර්තියෙන්ම ස්වයංභූ චලනයකි. හෙවත් වේගය පාදක කරගෙන ඒවාහි ශක්තිය විද්‍යාමාන වීම ස්වභාවිකයි. මේ ශක්ති ප්‍රභවය භෞතික විද්‍යාමෙවලමකින් ගණනින් සීමා නිර්ණය කිරීමේ හැකියාවක් නැත. දත්ත වශයෙන් සංඛ්‍යාත්මකව සිතිය නොහැක. අචින්තයයි. ''උපමා නසුකරා තං යාව ලහු පරිවත්තිතං'' වෙනස්වීම ලහුපරිවර්තනය පිළිබඳව උපමාවක් නැත්තේය. එමෙන් බාහිර බලවේගයකින්, නොපෙනෙන ගුප්තබලයකින් මේවාට ශක්තිය ලැබී ඇති බවක්ද කිසිසේත් ප්‍රකාශ නොවේ. එහි ප්‍රකෘර්තිය ශක්තියයි. ''ශක්තිය'' ස්වයංභූ චලනය මතින් හෙවත් වේගය පාදක කරගෙනම විද්‍යාමානවේ.


''ශක්තිය'' හටගන්නේ ''බලය'' හටගන්නේ කෙසේ දැයි උදාහරණයක් මගින් තහවුරු කර ගත හැක. විදුලිය ජනනය කරන හෙවත් ''බල-ශක්තිය'' ජනනය කරන විදුලි බලාගාර අප අහලා ඇත. ඇසින් දැක ද ඇත. විදුලි බලාගාරයේ ''විදුලිජනක'' යන්ත්‍ර ඇත. ජනක යන්ත්‍රය බලගන්වා හෙවත් පණ ගන්වා නැති අවස්ථාවක විදුලි ජනනය සිදු නොවේ. එසේ නම් ''ශක්තිය'' නිපදවීමට ''බලය'' නිපදවීමට යන්ත්‍රය ක්‍රියාත්මක කරවිය යුතුය. ක්‍රියාත්මක කරනවා යනු බලගන්වනවා

යනු කරකවනවා යනු ප්‍රවර්තනය කරනවා යන්නයි. තිබෙන තැන වෙනසකට භාවිතය වීමයි හෙවත් චලනයයි.





1 විදුලිබලාගාරය

2 ක්‍රියාකාරිත්වය හෙවත් පනගන්වා නැති ටර්බයින් යන්ත්‍රය - ජෙනරේටරය




2 රූප සටහන විදුහලි බලාගාරයේ ක්‍රියාකාරිත්වය සහිත ජනක යන්ත්‍රය (ටර්බයින් යන්ත්‍රය) එක දිශාවකට ප්‍රවේගවත්ව කරකැවේ. ඒ නිසා ''ශක්තිය'' ''බලය'' ජනනයවේ.




3 රූප සටහන ජනක යන්ත්‍රය සරල රේඛාවලින් දෙකට බෙදා වෙන්කර ගන්න. එක කොටසක් + ධන වශයෙන් ද එක කොටසක් - සෘණ වශයෙන් ද නම් කෙරේ. ‘‘+’’ කොටස (ධන) ‘‘ඇත’’ වශයෙන්ද ‘‘-’’ කොටස ‘‘නැත’’ (සෘණ) වශයෙන්ද සඳහන් කරන්න. වේගයෙන් කරකැවෙන විට ‘‘+’’ ‘‘ධන’’ ඇත කොටස ‘‘නැත’’ හෙවත් සෘණ ‘‘-’’ කොටසට පැමිණේ. ඒ සමගම නැත හෙවත් සෘණ ‘‘-’’ කොටසට ‘‘ධන’’ හෙවත් ‘‘ඇත’’ කොටස පැමිණෙන එකයි ස්වභාවය. ඒ සමාන්තර ශාපේක්ෂතා වේගය නිසාය. ප්‍රවර්තනය වීම නිසාය.

‘‘ඇත’’ නැතිවේ.
‘‘නැත’’ ත් නැතිවේ.

‘‘ඇත’’ නැති වේ යනු ‘‘නැති’’ බව හටගැනීමයි.
‘‘නැති’’ නැතිවේ යනු ‘‘ඇත’’ බව හටගැනීමයි.

ඒ නිසා ‘‘ඇත’’ යනු ‘‘+’’ හටගත් දෙයකි. ඒ නිසා නැතිවීම ප්‍රකටවන්නේ ‘‘නැත’’ ‘‘-’’ යනු හටගත් දෙයකි.

ඒ නිසා ''ඇත'' හටගන්නේ, ප්‍රකටවන්නේ. (මේ ''නැත'' යන්න මෙන්ම - ඇත යන්න **''හටගත්''** අර්ථයම විද්‍යාමාන බව වටහා ගත යුතුය.) මේ දෙකම ''ක්‍ෂය'' වේ. එනම් ''ඇත'' ත් නැතිවේ. ''නැතත්'' නැතිවේ. ''ඇත'' - ''නැත'' ''දු'' (දෙක) වේ. ක්‍ෂයවීම හෙවත් නැතිවීම ''ඛ'' වේ. දුඛ, දුක යනු වෙන් දැනගත යුතුයි.

මෙසේ ''දුක'' වුයේ වෙනස් වීම නිසාය. හෙවත් ''අනිත්‍ය'' වීම නිසායි.

**''යද නිච්චං තං දුක්ඛං''** යනුවෙන් වදාලේ මේ ධර්‍මතාවයයි. යමක් අනිත්‍ය නම් දුකයි. යමක් දුකනම් අනාත්මයි.


**''යද නිච්චං තං දුක්ඛං**
**යං දුක්ඛං තදනත්ථා''**

මේ පටිච්ච සමුප්පාද දහම - හෙවත් ස්වභාව ධර්‍මයේ යථාර්ථය නිතරම වෙනස් වන ස්වභාව ශක්ති වශයෙන් හඳුන්වයි. ප්‍රඥාවෙන් සමුදයවය දැකීම හෙවත් **පටිච්ච ''සමුප්පාදය දැකීම''** වේ **''නිසා හට ගැනීම''** නම්වේ. දහම දැකීමයි. සමුදය (හටගැනීම) වය (නැති වීම)

පටිච්ච (නිසා) + සමුප්පාද (හටගැනීම) පටිච්ච සමුප්පාදය දහම දැකීමයි. මේ දහම හෙවත් ස්වභාව ධර්‍මය දැකීමට බුදුන් දැකීම වේ. **''සෝ පටිච්ච සමුප්පාදං පස්සති සෝ මං පස්සති''**

ශක්තිය ගැන උදාහරණයක් මගින් වටහා ගනිමු.

රූප සටහන




රූප සටහනක් පෙන්නුම් කරන දල්වන ලද විදුලි බල්බයට **විදුලි ශක්තිය** ලැබුනේ කුමන පදනමක් කුමන සිද්ධාන්තයක් යටතේද? පිළිගත හැකි සාධාරණ හේතුවක් තිබිය යුතුය.

ඒ මෙසේයි. විදුලිය නිපදවන විදුලි බලාගාරයේ විදුලි ජනක යන්ත්‍රය බල ගැන්වීම පණ ගැන්වීම පදනම්ව ශක්තියක් ජනිත වේ. ඒ ශක්තිය මුලින් සඳහන් කල පරිදි ධන + සෘණ නිපදවේ. නිපදවන **ශක්ති ප්‍රභවය** - විදුලිය අපට උවමනා තැනට වයර් දෙකක් මගින් ගෙන එනු ලැබේ. එක වයර් එකක ''+'' ධන ආරෝපනයද තව වයර් එකක ''-'' සෘණ ආරෝපණය දවේ. ධන - සෘණ වයර් දෙක (නෙගටිවු - පොසිටිවු) විදුලි බල්බයට සම්බන්ධ වීමේදී විදුලි බල්බය දැල්වීම සිදුවේ. විදුලි ශක්තිය

හටගන්නේ ධන සෘණ සමාන්තර වේගය නිසාය හෙවත් ප්‍රවර්තනය විට මූලික සිද්ධාන්ත නිසාය. එසේනම් ධන වීමේදී විදුලිය ඉපදීමක් හටගැනීමත් ආලෝකයත්, සෘණ වීමේදී විදුලිය නැතිවීමත්, විසන්ධිවීමත් අන්ධකාරයත් සිදුවිය යුතුයි.

ධන යනු ඇතිවීම - සෘණ යනු නැතිවීම එසේනම් හටගන්නාවූ ශක්තියත් ඇතිවෙමින් - නැතිවෙමින් - ප්‍රවර්තනය වේ. ධන ආරෝපනය වීමේදී බල්බය දැල්වේ. සෘණ ආරෝපණයේදී ''නිවීම'' සිදුවේ. එසේ නම් බල්බයත් නිතරම පත්තු වෙනවා - නිවෙනවා / නිවෙනවා - පත්තු වෙනවා බල්බයේ මේ නිවීම පත්තු වීම අපේ පියවි ඇසට - මස් ඇසට - පේන්නේ නැහැ. විදු ඇසින් මේ නිවීම පත්තු වීම හෙවත් ඇතිවීම නැතිවීම දැකිය හැක. ප්‍රඥාවට ගෝචර වේ. නුවණැසට හිතාගත හැක. බල්බය පත්තු වන කොටම ආලෝකය විහිදේ. බල්බය නිවෙන කොට අන්ධකාරය ඇති වීම සිදුවිය යුතුය. නමුත් වේගය නිසා අපට ඇසට පේන්නේ නිරතුරුවම පත්තු වී බබලන ස්වභාවයයි. නමුත් එය නිරන්තරව අතරක් නැතිව පත්තු වෙන්නේ නැහැ. ශක්ති ප්‍රභවයක ක්‍රියාකාරීත්වයෙන් බලගන්වන නිසා නිවෙනාව, පත්තු වෙනවා බවයි. කිව යුත්තේ.

මේ උදාහරණය මගින් සියලු බල ශක්තිවල ස්වභාවය නිරන්තර අතරක් නැතිව වේගවත් බව සිතිය යුතුය. බුද්ධියට ගෝචර කර ගත යුතුය. ඒ නිසා සියලුම

රූප, ශක්ති හතරක් ගොනුවක් පුංජයක් නිසා ස්වභාව ධර්මයත් නිසා නිරන්තර ඇති වෙනවා නැති වෙනාව අනිත්‍යයි.

වේගය නිසා හටගන්නා ශක්තිය ඉඳුරන්ට ගෝචර නොවේ. මෙහිදී විශේෂයෙන් දැනගත යුත්තේ හටගන්නා බලය - ශක්තිය සත්ත්වයා සම්බන්ධයෙන් ඇති ඉඳුරන්ට ගෝචර නොවන බැවින් ඒ ශක්තිය ඇති බව දැන ගන්නේ විදුලි මෙවලමක් (විදුලියෙන් වැඩ කරන විදුලි බුබුලක් - විදුලි පංකාවක් වැනි) උපකරණයක් මාර්ගයෙනි.

මෙසේ පඨවි ශක්තිය - ආපෝ ශක්තිය - තේජෝ ශක්තිය - වායෝ ශක්තිය - එකටම විද්‍යාමනවේ. ඒක ස්වාභාවිකයි. වෙන්කල නොහැකි ධම්ම නියාමතාවයක්, ධර්මයට යටත්, නියාම හතරේ එකතුවට රූප කලාප නම යෙදේ. රූපකලාප රාශිය රූපය නම යෙදේ. රූපයත් ඉඳුරන්ට ගෝචර වේ. ශක්ති ඉඳුරන්ට ගෝචර නොවේ. ශක්තින්ගේ ස්වභාවය දැන ගත යුත්තේ ප්‍රඥාවෙන්මය ශුද්ධ ධර්ම ප්‍රවර්තනයේදී ඇතිවීම නැතිවීම හෙවත් අනිත්‍ය භාවය නිසාම විඤ්ඤා - නාම - රූප - ප්‍රකට වන්නේ. මේ නිසාය. පහල වන්නේ මේ ස්වභාව ධර්මයට ගස්, ගල්, පර්වත, ඉර, හඳ සතර පුද්ගල මම අපි පනවා ගනියි - සම්මුති නම ප්‍රඥප්ති වශයෙන් ව්‍යවහාර වේ. පඨවි ආදි ශක්ති වලින් රූපයත් - රූප දෙකක් එතුවෙන් විඤ්ඤානයෙන් විඤ්ඤානය හට ගැනීමෙන් නාම ධර්මත්

පහලවිම කිසිවකුට වෙනස් කල නොහැකි. එය **ධම්ම නියාමතා ධම්මට්ඨිතාව - ඉදප්පච්චයතා පටිච්ච සමුප්පාදය වේ.**

මෙම ධාතු හෙවත් ශක්ති සමූහික ප්‍රවර්තනය නිසා සම්මුති ලෝකය විද්‍යමානවේ. සංකත ලෝකය සකස් වුයේ ධාතු හතරක ගොනුවක් - පුංජයත්, කැටියක්, සාමූහික ප්‍රවර්තනයේම ස්වභාවය නිසාය. මේ ධාතු හතර අවකාශය නම් වු ශක්තිය තුලින් මතු වීම හෙවත් ප්‍රකට වීම ක්‍රියාවලියේ දී ''රූප කලාප'' නම් වු ධර්‍මතාවය වේ. රූප කලාප'' කෝටි ප්‍රකෝටි ගණනක් ඒකරාශි වීමේ ස්වභාවයේදී ''රූප'' නම යෙදේ. (මේ ඒකරාශි වීම ගොනුවීම පුංජයක් වශයෙන් ප්‍රකට වීම වේගය - චලනය - ප්‍රවර්වර්තනය හෙවත් ඇතිවීම නැතිවීම අනිත්‍ය තාව නිසා බව වටහා ගත යුතුය)

1. පඨවි ශක්තිය
2. ආපෝ ශක්තිය
3. තේජෝ ශක්තිය
4. වායෝ ශක්තිය
5. විඥ්ඥාන ශක්තිය
6. ආකාශ ශක්තිය යන **සියලුම ශක්ති සඳහා ඉහත දක්වු න්‍යාය ධර්‍මය හෙවත් ප්‍රවර්තනය සාධාරණ සිද්ධාන්තය කි.**

ජිනවචනය වන්නේ - බුදු වදනවන්නේ

**''යද නිච්චං තං දුක්ඛං**
**යං දුක්ඛං තදනත්ථා'' යනුයි**

**අනිත්‍ය - දුක්ඛ - අනාත්ම** වචන තුනම එකම වාක්‍යයක් වශයෙන් යෙදේ. හේතුව වෙන වෙනම වචනාර්ථය ගෙන පරිපූර්ණ අදහසක් ගෙන හැර දැක්විය නොහැක. යමක් **අනිත්‍ය** නම් පමණි **දුක** වන්නේ. ''**දුක**'' නම් ස්වභාවය ප්‍රකට වීමට වෙනස් වීම හෙවත් **අනිත්‍යතාවය** තිබිය යුතුය. **අනිත්‍ය දුක්ඛ** දෙකම ඇති වූ විට පමණි, **අනාත්ම තාවය** ප්‍රකට වන්නේ. එසේ නම් **අනාත්ම තාවය** වචනයක් වශයෙන් අර්ථ කථනය අර්ථ නිරූපණය පරිපූර්ණ අදහසක් ඇති වනවිටත් කිව නොහැක. ''**ත්‍රිලක්ෂණය**'' යනු වචන තුනක එකට පරිබද්ධව එකම ක්‍රියාකාරිත්වය ලක්ෂන තුනක් ප්‍රකට වන ස්වභාවයයි. මෙසේ සරල උදාහරණයක් මගින් එය නිරාකරණය කර ගනිමු.

උදාඃ- I **අම්මා බත් උයයි.**
II **ළමයා පැදුර වියයි.**

මෙහිදී ''**අම්මා**'' වෙනම ප්‍රකාශ කලාට සම්පූර්ණ අදහසක් දැක්විය නොහැක. කර්තෘ කෙනෙක් පමණි. ''**බත්**'' කිව්වත් ''**උයයි**'' කිව්වත් එසේමයි. ''බත්'' අදහසක් පමණි. ව්‍යාකරණයේදී කර්‍මය පමණි. උයයි යනු ක්‍රියාවකි. කුමක් ද උයන්නේ ? කව්රුද උයන්නේ ප්‍රශ්නාර්ථය නිතැතින් ඇති වෙනවා, පමණක් නොව තනි

වචනයකින් සරල ක්‍රියා දායමයක් පෙන්නුම් නොකරයි. **ළමයා - පැදුර - වියයි.** ''වියයි'' ක්‍රියාවකි. කව්ද ? කුමක්ද වියන්නේ යන ප්‍රශ්නාර්ථය ඇතිවේ. එය ස්වාභාවිකයි. හේතුව සම්පූර්ණ අදහසක් ගම්‍ය නොවන නිසා ළමයා පැදුර වියයි. සටහන තුල පරිපූර්ණම අංග සම්පූර්ණ අදහසක් වචන තුනම පරිබද්ධ වීම නිසා ඉදිරිපත් වී අඩුබවක් - ලුහුඬු බවක් - මදි බවක් නොපලවේ. වෙන වෙනම වචන යෙදුවට ක්‍රියාකාරිත්වක අදහසක් ගලපා ගත නොහැක. එසේම ඉහත **අනිත්‍ය - දුක්ඛ - අනාත්ම** වචන තුනම එකට යෙදීමෙන් පරිපූර්ණ අර්ථ විග්‍රහයක් දහම් විවරණයත් සම්පූර්ණ ධර්මස්කන්ධයක් ප්‍රකට වනු ඇත.

| පාලි | සංස්කෘත | සිංහල |
|---|---|---|
| අනිච්ච | අනිත්‍ය | අනිත<br>(අනිස) |
| දුක්ඛ | දුඃඛ | දුක |
| අනත්තා | අනාත්ම | අනත |

ඉහත යෙදුම් හා නුවණැස යොමු කරන්න. විශ්වයේ යම් හටගත් දෙයක් වේනම් ඒ සියලු ලෝක ධාතු සංකත වේ. සංකත යනු සකස් වීම්ය. සංකත වීමට ධාතුන්ගේ ඒකරාශී වීම විය යුතුය. මේ ධාතුන් ගේ සාමූහිකත්වය හෙවත් එකට ප්‍රකට වීම ධර්මානුකූලව පටිච්ච සමුප්පාදය දහම වේ. පටිච්ච සමුප්පාදය යනු **''නිසා හටගැනීමයි''** එනම් අනිත්‍ය තාවය නම්වූ ඇතිවීම

නැතිවීම ධර්මතාවයමයි. විශ්ව ලෝක ධාතුන්හි සවිඤ්ඤාණක අවිඤ්ඤාණක හෙවත් සචේතනික අචේතනික වශයෙන් ඊට පසු වර්ගී කරණය වේ. එය බෙදා හදා වෙන් කිරීමයි. එය විභජ්ජවාදී බවයි. සමස්ථ ග්‍රහවස්තුවලින් සවිඤ්ඤාණ හෙවත් සචේතනික ග්‍රහවස්තුවක් තුල විඤ්ඤාන ධාතුව හටගනී. විඤ්ඤාණ ධාතුව හටගැනීම තුල චේතනා පහලවේ.

ඒ ස්වභාවයට සතා පුද්ගලයා - මම - අපි නම්ගොත් දමා ඇත. මේ ග්‍රහවස්තු සවිඤ්ඤානකත්වය ප්‍රකට වන ග්‍රහවස්තුම වේ. සවිඤ්ඤානකත්වය තුලත් ක්‍රියාකාරිත්වයක් ඇත. අවිඤ්ඤානකත්වය තුලත් ක්‍රියාකාරිත්වයක් ඇත. සියල්ල ස්වභාව ධර්මයට අයත් වේ. කිසිම විදිහටක තම අනසකට යටත් කල නොහැකි ''**මම වෙමි - මගේ වේ - මගේ ආත්මයවේ**'' වශයෙන් මමායනය කල හැකි ධර්මතාවයත් නොවේ.

සම්මුති වශයෙන් සතා පුද්ගලයා මම වශයෙන් නම් කර ඇති මේ ස්වභාව ධර්මය හෙවත් ග්‍රහවස්තුවෙහි (ග්‍රහවස්තු :- ගල් - පර්වත - ගස් - ජලය - ඉර - හඳ - සුළඟ - ගිනි සියල්ල රූපවේ.) විඤ්ඤාණ ශක්තිය නම් ධාතුව හටගනී. කිසිම කෙනෙකුගේ මෙහෙයවීමක් නොමැතිව බලපෑමක් නොමැතිව ස්ථාන හයක ''**විඤ්ඤාණ ධාතුව**'' හටගනි. ඇස - කණ - නාසය - දිව - කය මන රූපයි. ධාතු හතරකි. එහි ප්‍රසාද රූප වේ. ඒවාද ධාතු හතරකි. ප්‍රසාද රූප වෙත වර්ණ රූප - ශබ්ද රූප -

ගන්ධ රූප - රස රූප - පොට්ඨබ්බ රූප - ධම්ම රූප ඇදී පැවතීම, සම්බන්ධ වීම, ස්වභාව ධර්මයකි. එසේ වීමේදී විඤ්ඤාණය හටගනී. මේ ස්වභාව ධර්මය හට ගැනීමේදී නාම ධර්ම පහක් හටගෙන සිතක ක්‍රියාත්මක භාවයත් ස්වභාව ධර්මයේ ක්‍රියාකාරීත්වයත් පෙන්නුම්කරයි. මේ ක්‍රියාකාරීත්වයට සත්‍ව පුද්ගලයා මම යොදා ගැනීම දහමට පටහැනියි. සම්මුතියක් පමණි.

ශුද්ධ ධර්ම ප්‍රවර්තනයේදී ඇතිවීම නැතිවීම පදනම්ව විඤ්ඤාණ - නාම - රූප පහල වීම සිදුවේ. **රූපයේ මූල ශක්ති පඨවි, ආපෝ, තේජෝ, වායෝ වේ. නාමයේ මූල ශක්තිය විඤ්ඤාණය වේ.** පඨවි ආදී ශක්ති ස්වයංභූ චලන වෙමින් අන්‍යොන්‍ය වීමේදී දඟලන විඤ්ඤාණපොදි - නාම රූප පොදි - ගොනු - කුසල ධර්ම ගොනු පොදි - අකුසල ධර්ම පොදි ගොනු ප්‍රකට වීම ස්වභාවිකයි. තව පැත්තකින් ''මම'' නම යොදා ඇත. ''අප'' නම යොදා ඇත. ගල් - දිය - ගිනි - සුලං වශයෙන් යොදා ඇත. වර්තමාන අතීත අනාගත කාල වකවානු යොදමින් බාල මහළු තරුණ මෙන්ම උපත මරණ භාව අභාව ආදි නම් හොත් දමා ගෙන ඇත. ධාතුන්ගේ අසමතුලිත තාවයේදී ලෙඩ රෝග නමයෙදේ. ධාතුන්ගේ සමතුලිත තාවයේදී නිරෝගි බව කියවේ. ධාතුන් ගේ අසමතුලිත තාවයෙන් සුළි සුලං - ගංවතුර - භූමිකම්පා සිදුවේ. සමතුලිත තාවයෙන් සෞම්‍ය දේශගුණික තත්ත්වයන් ප්‍රකටය. ධාතුන්ගේ අසමතුලිත තාවයෙන් වා -

පිත් - සෙම් කෝපවේ. සමතුලිත තාවයෙන් කෝපවීම සමනය වේ. ස්වභාව ධර්මයේ ස්වභාවයයි.

★ පඨවි ආදි ශක්ති හතරක ගොනුවක් වූ ස්වභාව ධර්මයේ ස්වභාවය වූ **ඇස** නැමැති රූපය නිතරම ඇති වෙනවා නැතිවෙනවා අනිත්‍යයි.

★ ඇස නම් වූ රූපයට සම්බන්ධව පවත්නාවූ **චක්ඛු ප්‍රසාද** රූපය නිතරම වෙනස් වෙනවා ඇති වෙනවා - නැතිවෙනවා අනිත්‍යයි.

★ බාහිර ලෝකයෙන් ප්‍රසාද රූපයට ඇදී පවතින **වර්ණ රූපයද** නිරන්තරව වෙනස් වෙනවා වෙනස් වෙනවා - ඇති වෙනවා නැතිවෙනවා අනිත්‍යයි.

★ මේ දෙක එකතු වීමේදී හටගන්නා (අභ්‍යන්තර ඇස හා බාහිර වර්ණ රූපය) **චක්ඛු විඤ්ඤාන** ධාතුවද ඇති වෙනවා නැතිවෙනවා වෙනස් වෙනවා අනිත්‍යයි.

★ චක්ඛු විඤ්ඤාන ධාතුව සමග පෙර පසු නැතිව හටගන්නා නාම **ධර්ම පහ** අනිත්‍යයි.

★ **ඵස්සයත්** ඒ ස්වභාව ධර්මයට යටත් නිසා අනිත්‍යයි.

★ **වේදනාවත්** ඒ ස්වභාව ධර්මයට යටත් නිසා අනිත්‍යයි.
★ **සංඥාවත්** ඒ ස්වභාව ධර්මයට යටත් නිසා අනිත්‍යයි.

* **චේතනාව** ඒ ස්වභාව ධර්මයට යටත් නිසා අනිත්‍යයි.

* **මනසිකාරය** ඒ ස්වභාව ධර්මයට යටත් නිසා අනිත්‍යයි.

මෙම නාම ධර්ම පහේ ක්‍රියාකාරීත්වය වූ පංච උපාදානස්කන්ධය - හෙවත් හිත හෙවත් ලෝකයම අනිත්‍යයි - දුකයි - අනාත්මයි. වේගයකි - **මුලු ලෝකයම වේගයකි.**

මේ ධර්මතාවය විදසුන් නුවණින් - එළඹ සිටි සිහියෙන් - යෝනිසෝමනසිකාරයෙන් - ප්‍රඥාවෙන් දැකීමේදී කිසිම සංකත ධර්මයත්

* අනිත්‍ය නිසා නිත්‍ය නොවේ.
* දුක නිසා සුඛ නොවේ.
* අනාත්ම නිසා ආත්මනොවේ.

එමනිසාම

* අනිත්‍ය නම් ගත හැකි දෙයක් නොවේ.
* දුක් නම් ගත යුතු දෙයක් නොවේ.
* අනාත්ම නම් කල යුතුවේ.

මම කියා ගත හැකි නොවේ. මගේ කියා ගත හැකි නොවේ. මගේ ආත්මය කියා ගත හැකි නොවේ.

| | |
|---|---|
| ධම්මං පස්සති | 7 |
| ධම්මනියාමතා | 6 |
| ධම්මට්ඨිතා | 5 |
| ඉධප්පච්චයතා | 4 |
| පටිච්චසමුප්පාදය | 3 |
| අනිත්‍යයි | 2 |
| ඇතිවෙනවා + නැතිවෙනවා | 1 |

මේ රූප සටහනේ අංක 1 හි ධාතූන්ගේ මූල ස්වභාවය යථාභූත භාවය ප්‍රකට කිරීමට හැඟවීමට ''ඇති වෙනවා - නැතිවෙනවා'' යන න යෙදේ. නමුත් ''ඇත'' (අත්‍ථි) හෝ ''නැත'' (නත්‍ථි) වශයෙන් පනවන්න ප්‍රකට කරන්න පුළුවන් කමක් නැත. හේතුව ''ඇත'' වහා නැති වෙනවා නැත ද වහා නැති වෙනවා. ගිනිය නොහැකි වේගයකින් අත්‍ථි - නත්‍ථි දෙකම වෙනස් වේ නැතිවේ. ඒ නිසා දහමේ

**අත්‍ථීති ඒකො අන්තො**

**නත්‍ථීති ඒකො අන්තො**

යනුවෙන් ඒ ධර්‍මතාවය විස්තර කර ඇත. මහණෙනි, ''ඇත'' කිව්වත් අන්තයක් වේ. හෙවත් දූෂ්ටියට පැමිණීම වේ. (ශාස්වත දූෂ්ටිය) ''නැත'' කිව්වත් දූෂ්ටියකට යයි.

අන්තයකට පත් වේ. (උච්ඡේද දෘෂ්ටියවේ.) ඒ නිසා මේ අන්ත දෙකකට නොගොස් මධ්‍යම ප්‍රතිපදාවෙන් කරුණු දක්වීම නම් ''අනිත්‍ය'' වේ.

**''උභොගම්මා මජ්ඣිමා පටිපදා**
**තථාගතො ධම්මං දෙසෙති''**

තථාගතයාණන් වහන්සේ මේ අන්ත දෙකෙන් එකකට වත් නොගොස් මධ්‍යම ප්‍රතිපදාවෙන් දහම් දෙසති. එනම් අංක 2 හි සඳහා වචනය වු ''අනිත්‍යම'' දේශනාකරති. ඒ නිසාය, අනිත්‍ය නිත්‍ය වන්නේ. ''**අනිච්ච නිච්චා සමණා වදන්ති**'' අනිත්‍ය දැකීම යනු 3 අංකයේ සඳහා **පටිච්ච සමුප්පාදය** නුවණින් දැකීමයි. එයම දැකීම දහම දැකීම නම් වේ.

**''සෝ පටිච්ච සමුප්පාදං පස්සති**
**සෝ ධම්මං පස්සති''**

යමෙක් පටිච්ච සමුප්පාදය දකිනවා යනු නුවණින් ''**අනිත්‍යානු දර්ශනය**'' දැකීමම වේ. මෙසේ අංක 4 සඳහන් **ඉධප්පච්චයතාව,** අංක 5 සඳහන් **ධම්මට්ඨිතිතා,** අංක 6 සඳහන් **ධම්ම නියාමතා** ක්‍රමානුකූලව අනුපිලිවෙලින් දහම් දැනුම තමාතුළ වර්ධනය වේ.

**අනිච්චා වත සංඛාරා**
**උප්පාද වය ධම්මිනො**
**උප්පජිත්වා නිරුජ්ඣංති**
**තෙසං වූප සමොසුඛො**

ශාන්ති නායක සම්මා සම්බුදු

පියාණන්වහන්සේ විසින් ස්වයංභූ ඥාණයෙන් අවබෝධ කර වදාල ශ්‍රී සද්ධර්මය සතර පද ගාථා රත්නයට ඇතුලත් කර සියලුම ලෝක ධර්මයන්ගේ ස්වභාවය ''අනිත්‍ය'' බව ප්‍රකට කරති.

හටගත් සියලු දේ හෙවත් ලෝකය (හිත) අනිත්‍යයි. ඇති වීම නැතිවීම ධර්මතාවයට යටත් සවිඤ්ඤාණක - අවිඤ්ඤාණක උපන් සියල්ල නැතිවීම ස්වභාවය කොට ඇත. මෙම ධර්මයම , දර්ශනයම අස්සජි මහරතන් වහනසේ උපතිස්ස පරිබ්‍රාජකයාට දේශනා කළහ.

**යෙ ධම්මා හේතුප්පභවා**
**තේසං හේතුං තථාගතො ආහ**
**තේසං ච යො නිරොධො**
**එවං වාදී මහා සමණො**

සංකත සියලු දේ හේතුවක් නිසා හටගෙන ඇත. එනම් ''අනිත්‍ය'' තාවයයි. අනිත්‍ය බව විදසුන් නුවනින් දැකීමෙන් භව නිරෝධ කළ හැක.

**කතමානන්ද අනිච්ච සඤ්ඤා ? ඉධානන්ද භික්ඛු අරඤ්ඤ ගතොවා රුක්ඛමූල ගතොවා සුඤ්ඤාගාර ගතෝවා ඉති පටි සංචික්ඛති.**

**රූපං අනිච්චං**
**වේදනා අනිච්චා**
**සඤ්ඤා අනිච්චා**
**සංඛාරා අනිච්චා**
**විඤ්ඤාණං අනිච්චන්ති**

**ඉති ඉමේසු පංච උපාදානස්ඛන්ධෙසු අනිච්චානු පස්සි විහරති ''**

'' කුමක්ද ? ආනන්ද අනිත්‍ය සඤ්ඤාව යනු. ආනන්ද කෙලෙස් තවන වියර්යෙන් යුත් භික්ෂුව කැලයට , ගස් මුලකට , හිස් බිමකට , ගොස් යෝගාසනාව තැන්පත්ව මෙසේ සිතයි , මෙනෙහි කරයි.

1. රූපය අනිත්‍යයි.
2. වේදනා අනිත්‍යයි.
3. සඤ්ඤාව අනිත්‍යයි.
4. සංඛාරය අනිත්‍යයි.
5. විඤ්ඤාණය අනිත්‍යයි.

මේ පංච උපාදානස්කන්ධය හෙවත් හිත අනිත්‍ය වශයෙන් විදසුන් වඩයි. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් දස සංඥා වලින් මුලින්ම සඳහන් **''අනිත්‍ය සංඥාව''** විස්තර කර ඇත්තේ ඉහත සඳහන් පරිදිය. මෙසේ ප්‍රකාශිත අනිත්‍යානු දර්ශනය , අනිච්චානු පස්සනාව, අනිච්ච සඤ්ඤාව , කුමක්දැයි හරි හැටි තේරුම් ගත යුතුය. සම්මුති වශයෙන් - ව්‍යවහාර වශයෙන් හඳුනා ගැනීම් සඳහා නම් කර ඇති සියලු සවිඥානක අවිඥානක ගස්, ගල්, පර්වත , සතා , පුද්ගලයා , මම අපි, භෞතික සියලුම දෑ ''සංකත'' වේ. මේවායේ හැඩතල හට ගැනීමේ ස්වභාවය අනුව සම්මුති නාම ව්‍යවහාර කෙරේ. සඤ්ඤා නාම වශයෙන් වෙන් වෙන්ව නාම යොදා ඇත. මේ සියල්ලම සුද්ධ ධර්ම හෙවත් ධාතු හයක - ශක්ති හයක සාමුහික ඝනීභූත භාවය පාදක කරගෙන

ප්‍රකට වේ. ''සංකත'' නම යෙදී ඇත්තේ සුද්ධ ධර්ම හය එකට ප්‍රකට වීම නිසාය. පඨවි , ආපෝ , තේජෝ , වායෝ ධාතු හතර එකරාශී වූ විට රූප වශයෙන් ව්‍යවහාර වේ. විඤ්ඤාණ ශක්තිය රූපයක් ආශ්‍රිතව ප්‍රකට වන ස්ථාන සතා පුද්ගලයා මම අපි වශයෙන් නම් කර ඇත.

1. පඨවි ධාතුවකි. ශක්තියකි. සනත්‍වය විද්‍යාමාන වන්නාවූ ස්වභාවය ධර්මයකි. නිතරම වෙනස් වේ. අනිත්‍යයි - දුකයි - අනාත්මයි.

2. අපෝ ධාතුවකි. ශක්තියකි. ඇලෙන , වැගිරෙන බැඳෙන ස්වභාවය ගත් ස්වභාව ධර්මයකි. නිතරම වෙනස් වේ. අනිත්‍යයි, දුකයි , අනාත්මයි.

3. තේජෝ ධාතුවකි. ශක්තියකි. උණුසුම් බව දවාලන බව දිරවන බව ගත් ස්වභාව ධර්මයකි. නිතරම වෙනස් වේ. අනිත්‍යයි , දුකයි අනාත්මයි.

4. වායෝ ධාතුවකි. ශක්තියකි. හමායන ස්වභාවය තල්ලු කරන ස්වභාවය ගත් ස්වභාව ධර්මයකි. නිතරම වෙනස් වේ. අනිත්‍යයි, දුකයි - අනාත්මයි.

5. ආකාශ ධාතුවකි. ශක්තියකි හටගත් දෙයකි. නිතරම වෙනස්වේ. ස්වභාව ධර්මයකි. අනිත්‍යයි , දුකයි, අනාත්මයි.

6. විඤ්ඤාණ ධාතුවකි. ශක්තියකි. බාහිර ලොකයේ වර්ණ, ශබ්ද, සන්ධ , රස පොට්ඨබ්බ,

ධම්ම ගැන දැනුවත් වීම සිතක් සකස් කිරීමේ ශක්තිය. සවිඤ්ඤානකත්වය. සත්වයා සම්බන්ධව පමණක් හටගනී. අනිත්‍යයි - දුකයි - අනාත්මයි.

ඉහත දැක්වූ ශක්ති හයෙන් මුල් හතර (පඨවි, ආපෝ, තේජෝ, වායෝ) ස්වභාව ධර්ම හතර එකට ඒකරාශිවී පවතී, වෙනස් වේ. වෙන්කල නොහැක. හතර වෙන් නොවන නිසා ඒකීයත්වයක් පාදක කරගෙන විද්‍යාමන අවස්ථාවක ''රූපයක'' නම යෙදේ. තනිව ජනිත වීමක් නැත. ප්‍රකට වීමක් විද්‍යාමාන වීමක් පෙනී සිටීමක් කිසිසේත් සිදු නොවේ මය - එක ධාතුවක් යම් තැනක විද්‍යමාන වෙන්නේනම්, අනිත් ධාතු තුනම තිබිය යුතුය. විශේෂයෙන් සෑම රූපයකම එක ධාතුවක් වැඩි පුරගත් අවස්ථාවක් මයි ඇත්තේ. සතර මහා භූතයෝ නමින් ප්‍රකටය. භෞතික නම ද ව්‍යවහාර වේ.

මෙම රූප තමයි සත්වයන්ගේ ඉඳුරන්ට ගෝචර වන්නේ. ඉඳුරන් හයක් ඇත. ඒවාට ගොදුරු වන්නේ සම්බන්ධ වන්නේ මෙසේය.

1. ඇස අභ්‍යන්තර රූපයට - බාහිරින් වර්ණ රූපය ගෝචර වේ - චක්ඛු විඤ්ඤානය

2. කණ අභ්‍යන්තර රූපයට - බාහිරින් ශබ්ද රූපය ගෝචරවේ - සෝත විඤ්ඤානය

3. නාසය අභ්‍යන්තර රූපයට - බාහිරින් ගන්ධ රූපය ගෝචරවේ - ඝාන විඤ්ඤානය

4. දිව අභ්‍යන්තර රූපයට - බාහිරින් රස රූපය

ගෝචරවේ - ජිව්හා විඤ්ඤාණය

5. කය අභ්‍යන්තර රූපයට - බාහිරින් පොට්ඨබ්බ රූපය ගෝචරවේ - කාය විඤ්ඤාණය

6. මන අභ්‍යන්තර රූපයට - බාහිරින් ධම්ම රූප (සිතුවිලි) ගෝචර වේ - මනෝ විඤ්ඤාණය

සත්වයාත් ස්වභාව ධර්‍මයක් අභ්‍යන්තර රූපයත් පිහිටීම ස්වභාව ධර්‍මයක්. අභ්‍යන්තර රූප වල ඔපවත් ස්වභාවය - දීප්තිමත් ඔපවත් ස්වභාව - ස්වභාව ධර්මයක් බාහිරෙන් එම දීප්තිමත් ඔපවත් ස්වභාවයට රූප ඇදී පැවතීම සම්බන්ධීකරණය එස්සය වීමත් ස්වභාව ධර්‍මයකි. ඉහත දැක්වූ පඨවි ආදි ශක්ති හය ශුද්ධ ධම්ම නමින් හැඳින්වේ.

ඊළඟට මේ සුද්ධ ධර්‍ම හෙවත් ධාතු වලට **''ශක්තිය''** ලැබෙන්නේ කෙසේ දැයි ධර්‍මානුකූලව විමසිය යුතුය. යම් දෙයක - යම් තැනක ශක්තියක් විද්‍යමාන වන්නේ නම් එහි **චලනයක්, වෙනස් වීමක්, භ්‍රමණයක්, ප්‍රවර්ථනයක්, ඇතිවීමක්, නැතිවීමක්, පටිච්ච සමුප්පන්න බවක්, ධනරිණ අතර නිරන්තර චලනයක් ප්‍රකට විය යුතුමය.**

**කම්මස්ස කාරකො නත්ථි**
**විපාකස්සච වේදකො**
**සුද්ධ ධම්මා පවත්තන්ති**
**එසේවං සම්ම දස්සනං**

**සුද්ධ ධම්මා** - පඨවි ආදි ධාතු හයයි.
**පවත්තන්ති** - ප්‍රවර්ථනය වෙනවා - වෙනස්

වෙනවා - චලනය වෙනවා - ඇති වෙනවා - නැති වෙනවා - අනිත්‍යයි.

**සම්ම දස්සනං** - විදසුන් නුවණින් දකින්න.

ක්‍රියාවක් ඇත. කරන්නෙක් නැත. විඳීමක් ඇත. විඳින්නෙක් නැත. පඨවි ආදි ශුද්ධ ධර්‍මයන්ගේ වෙනස්වීමක් පමණි. අනිත්‍ය තාවයකි. මෙය ප්‍රඥාවෙන් දකින්න. මිත්‍යාදෘෂ්ටියෙන් අත්මිදීමට හැක. යමෙක් විශ්ව පදාර්ථයේ (විශ්ව පරමාර්ථ ධර්‍ම වල මූලය) විශ්ව සම්භවයේ ඉධප්පච්චයතාවය (නිසා හටගැනීම) යථාවත්ව ප්‍රඥාවෙන් දකීනම් හේ **පටිච්ච සමුප්පාදය** දකින්නෙක් වේ. විශ්ව පදාර්ථ (ධාතු - ශක්ති) පඨවි ආපෝ ආදී මූල ශක්තීන් හි පටිච්ච සමුප්පන්න භාවය නුවණින් දකීමක් ඇති කරගත යුතුවේ. මේ පටිච්චසමුප්පන්න බව ප්‍රඥා චක්ෂුසයෙන් දැකීමම ස්වංජනිත පදාර්ථයේ යථාර්ථය ධර්‍මය දැකීම වේ. ස්වයම්භූ ඥානයෙන් සත්‍ය අවබෝධ කළ උත්තමයාණන් වහන්සේ **තථාගත බුද්ධ** නම් වේ. මේ ධර්‍මතාවය මනෝ භාවයන්ට විෂය ගෝචර නොවන ජගත් විශ්ව පදාර්ථය සුඤ්ඤතා දර්ශනය හෙවත් සංඥා විරහිත ඇත්ත ඇති සැටියෙන් යථාභූතඥානය නම් වූ ''**රෝධ**'' නැති හෙවත් ''**නිරෝධය**''නම් වූ අප්පනිහිත නම් වූ අව්‍යාකෘත මේ මේ යයි පෙන්වා ඉන්ද්‍රියට විෂය ගෝචර කල නොහැකි මනෝ භාවය ඉක්මවා ගිය සුන්‍යත්‍වයකි. හිස් ස්වභාවයකි.

මුලු භෞතික ලෝකයම වේගයකි! වේගය නිසා ''ඇත'' කියා වැරදි විදහට ගන්නවා. දකිනවා. එය මායාවකි. සම්මුතියක් වශයෙන් පනවා ගැනීමකි.

පරමාර්ථ වශයෙන් විද්‍යාවෙන් ඇත්ත ඇති සැටියෙන් සම්පූර්ණයෙන්ම වැරදිය. වැරැද්ද යනු මිසදිටුවකි. අවිද්‍යා අන්ධකාරයේ නිමග්න වී සිටින තාක් කල් සත්‍ය දැකිය නොහැක. විද්‍යා ආලෝකය - ප්‍රඥාව නම් වූ ඇස (පැණස) පහල වන තුරු අවිදු අඳුරමයි. සම්බුදු සමය තුළ දීම අවිද්‍යා අන්ධකාරයෙන් මිදී විද්‍යා ආලෝකය ලබාගෙන දුකෙන් අත්මිදි නිවෙන්න උත්සාහ ගන්න.

''නිවන''ස්වභාවයෙන්ම ස්වභාව ධර්‍මයකි. අප්‍රකට බවේ ප්‍රකත්වයයි. එම තත්ත්වය උපකල්පනය කරන්න. චින්තාවක් මනසිකාරයක් නොයෙදේ. **බුද්ධ මනස හෙවත් සම්මා සම්බෝධිය අසම සම වන්නේ එනිසාය.** යථාර්ථයේ දී සියලු සංඥා සුන්‍යත්ත්වයට පත්වන බැවිනි.

ප්‍රඥාවෙන් අවදිවීම යනු ප්‍රත්‍යක්ෂවීම යනු චේතනය නොවීමයි. චේතනයේ ක්‍රියා විරහිත භාවයයි. මනසිකාරය නොවීමයි. මෙනෙහි නොකිරීමේ ස්වභාවයයි. **විඤ්ඤාණය මත යමක් පනවන්නේ නම් ''මම'' පාදක කරගෙන දෘෂ්ටි ගත වීමකි.** අචින්තනයේ දී අමනසිකාරයේ දී ඵස්ස නිරෝධයේදි උත්පාද හෙවත් හටගැනීම් නිරෝධය හෙවත් නැතිවීම් හෝ පැනවීමට නොහැකි ස්වභාවයකි. ලෝක ධර්‍මයන් ප්‍රකට වීම නැත. ඒ නිසාවෙන් අනිමිත්ත සමාධි මනස මහා ප්‍රඥාව යයි කියනු ලැබේ. නිමිත්තෙන් තොර අපේක්ෂකත්වයෙන් තොර හැඟුම්බර බවෙන් තොර - දොඩමළු බවෙන් තොර ශූන්‍යතා දර්ශනය ''බුද්ධ'' නම්වේ. ඒ ධර්‍මතාවය තුළ රූපයාගේ සුන්‍යත්වය තුළ නිරපේක්ෂ නාමධර්‍ම තුළ උපත - විපත නොපැනවෙන බැවින් ජාති - ජරා - මරණ ශෝක - පරිදේව ධර්‍මතා නිරුද්ධ කළ බව ප්‍රකට වේ.

රූපයන්ගේ ඵස්සයෙන් ඉවත්වීම සඳහා රූපයන්ගේ සම්බන්ධීකරණයෙන් මුක්තවීම හෙවත් මිදීම සඳහා රූපයේ සාපේක්ෂතාවය හෙවත් පටිච්චිය මත ''මනස'' සුන්‍යත්වය කරා යාමට ඉඩ ප්‍රස්ථාව ඇති කර ගනී. රූපයේ යථාර්ථය යථාවත් වන විට ඇත්ත ඇති සැටියෙන් දකින විට එහි භෞතික ප්‍රකටවීමේ ස්වභාවය නොව අප්‍රකට බවේ යථාර්ථය යෝගවචරයා ප්‍රඥාවෙන් දකී. එනම් එහි සුන්‍යත්‍වයයි. ''රූප සංඥා'' නොමැති තැන භාවමය ප්‍රකාශ, පිළිගැනීම්, ප්‍රකට වීම් කිසිසේත් සිදු නොවේ. **'ඒ ධර්මාවබෝධයයි.'**

**''පරම සත්‍යවූ බුද්ධ මන නිසලයි. අජීවී දේ සසල බවෙන් තොරයි. අජීවත්‍වය අසංකත වේ.''**

**'යෝ ධම්මං පස්සති**
**සෝ මං පස්සති**
**යෝ ධම්ම පස්සති**
**සෝ බුද්ධං පස්සති''**

අධර්මයෙන් ධර්මය වැසී ඇත. අවිද්‍යාවෙන් විද්‍යාව වැසී ඇත. **රූපමය මනසින් බුද්ධ මනස වැසී ඇත.** ධර්මය දකින විට බුදුන් දකී. අවිද්‍යාව දුරුවන විට විද්‍යාව ලංවේ. ප්‍රකෘතිය ප්‍රඥාවෙන් දකින්න. ස්වභාව ධර්මයේ මූලය වෙත යා යුතුය. ප්‍රකෘතිය යනු ඇත්තයි. විකෘතිය යනු නැත්තයි; හෙවත් රූපමය මනසයි. එසේ නම් රූපමය මනසින් යථාර්ථය දකින්න බැරිය. රූපමය මනසින් නික්මීම මයි ''බුද්ධ මනස'' වන්නේ. **මනසින් අවදිවීම යනු අමනසිකාර නම් වූ තත්‍වයයි.** ඒ ශක්තිය ඔබ මා තුළ ඇත. තමාතුළ බුදුන් වැඩ සිටිතියි යනු එයයි.

''හොල්මන'' යනු සෙලවෙන මනයි. සසල බවයි. චංචලත්‍වයයි. අප මවාගෙන ජීවත්වන සම්මුති ලෝකයේ භෞතිකත්‍වය නිසාම සත්‍යවූ කිසිවක් කිසි තැනක දැකිය නොහැක, නුවණැසට හැර. **මොනයම් හෝ ක්‍රමයකින් ලෝක ධර්‍මයන් ''සත්‍යයයි'' කියා ග්‍රහණය කර ගන්නේ නම් ඒ ඔබගේ අනවබෝධයයි.** විඤ්ඤානයට වහල්වීමම සත්‍ය වසන් කර ගැනීමකි. එකම ප්‍රතිපදාව ''නිසොල්මන්'' වීම සඳහා කටයුතු කිරීමයි. එවිට අධර්‍මයෙන් ධර්‍ම කරා යනු ඇත. අසත්‍යයෙන් සත්‍ය කරා යනු ඇත. දොඩමළු උනොත් ඔබේ මනස අසත්‍යයෙන් වසාලනු ඇත. (දොඩමළු යනු අතීත - අනාගත ධර්‍මරූප වලින් මන කැලතීමයි) එනිසා සත්‍ය කියා දකින්නේ අසත්‍යයයි. ධර්‍මය කියා දකින්නේ අධර්‍මමයයි. මනස විද්‍යාවෙන් යුක්ත වූ විට ප්‍රඥා භාවනාව වේ. **''නිසොල්මන''** **''මහා නිහඬ බව''** හැර වෙන කුමක්ද? මුනි බවයි. මෞනත්‍වයයි.

රූප සංඥා මනිසිකාරය වන්නේ මෙසේය; සතර මහා භූත **''රූප නාමයෙන්''** පෙනී සිටින වර්ණ රූප - ශබ්ද රූප - ගන්‍ධ රූප - රස රූප - පොට්ටබ්බ රූප - ධම්ම රූප **''ඵස්ස''** යෙදී වේදනා සංඥා චේතනා මනසිකාර වේ. එවිට ඒ බාහිර රූප සම්බන්ධයෙන් වෙන් වෙන්ව මනසිකාරය සිදුවන අතර සංඥාව බලවත් වේ. ඉන්ද්‍රියානු බද්ධ අරමුණු ආලම්බන - ගති සම්බන්ධයෙන් විවිධ හැඬ තල මවාගෙන ඇලීම් ගැටීම් (තණ්හාව) මත සංඥාව බලවත් වේ. සම්බුදුවරුන්ගේ අවවාදය එන්නේ **''රූප සංඥා''** චිත්ත සංකාර බවට පත්වීමට ඉඩ නොදීම **රූපයේ සංඥා සුන්‍යත්වයට පත් කිරීම මන අක්‍රිය කිරීමේ**

ප්‍රධාන කටයුත්තයි. එනම් ''මන'' නිහඬ කිරීමයි. ''හඬ තැලීමට'' ඉඩනොදීමයි. එනම් නිසොල්මන් වීමයි. **රූප සංඥා නිමිති වශයෙන් නොගැනීම අනිමිත්ත සංඥාව වේ. රූපයාගේ සුන්‍යත්‍වයෙන් අනිමිත්ත සමාධි වනු ඇත.**

අප බොහෝ විට ධ්‍යාන අරමුණු මත සිත සමාධි ගත කර පැය කීපයක් සිටින අවස්ථා ඇත. ඒ මන ශක්තිමක් කර ගැනීම සඳහායි. ධ්‍යානයෙන් අවදි වී ප්‍රකෘති ලෝකය හා සම්බන්ධ වන විට ''මම පැය කීපයක් ධ්‍යානයට සමවැදි සිටියා! කාලය ගියාද කියා දැනුනේ නැහැ'' යනුවෙන් පවසයි. මෙහිදි සිදුවන්නේ විඥ්ඥානයාගේ පැවැත්ම සඳහා බාහිර ලෝකය හා සම්බන්ධවීම නතර වීමත් කාලය හා ගනුදෙනු නොකිරීමත් මෙහි යථාර්ථයයි. මෙයින් පැහැදිලි වන්නේ ලක්‍ෂ සංඛ්‍යාත අරමුණු ''මන'' නිරන්තරව ග්‍රහණය කිරීම නිසා කාල සටහනක් නිර්මාණය වීමයි. ''**අරහත් ඵලය**'' දී ''**නිරෝධ සමාපත්තිය**'' දි ඵස්ස නිරෝධනය වන නිසා කාලය පැනවීමක් සටහන් නොවේ. (ශුද්ධාවාස බ්‍රහ්ම තලයන් හි අනාගාමි උත්තමයෝ කල්පගණන් නිරෝධ සමාපත්ති සුවයෙන් වාසය කරන්නේ'' කාල සටහනක් නොමැති නිසයි. මිනිස් ලොව දින හතකි. හේතුව ''**කරජකය**'' පැවැත්වීමට ''කබලිංකාර ආහාර'' දිමට සමාධියෙන් අවදිවිය යුතුය.)

බෝධිසත්ව ගුණෝපේත ඔබ වෙතද මා වෙතද උපතින්ම නිවීමේ මාර්ගය විවෘර්තව ඇත. ඒ බව නොදත් අප වෙන මගක යාමෙන් අතහැරීමෙන් ලබන සැනසිල්ල ලං කර යාමට නොහැකිව ඇත. ප්‍රකෘති මනස හෙවත්

පිවිතුරු මනස හරිමග හෙවත් ''බුදුමග'' ගොස් ලබා ගත යුතුය. ඒ සඳහා නිසොල්මන් වීමේ හෙවත් නොසිතුවිල්ලේ තැනට යොමු වීමේ ප්‍රතිපදාව අනුගමනය කළ යුතුය. ඒ ලෝක ධර්මයන්ගෙන් නිදහස් වීමයි. අතීත - අනාගත - වර්තමාන සිතුවිලි වල පැටලි නොසිටීමයි. සියලු දේ දකින නමුදු - ඇසෙන නමුදු - විඳින නමුදු ඒ ස්වභාව ධර්මයාගේ ස්වභාවය බව යම් මොහොතක ප්‍රඥාවෙන් දකින්න හැකි වීමම නිවීම වේ. ඔබට එහි දී කිසිම දෙයක් කරන්න නැත. කර්තෘත්වයක් නොමැති නිසා. කොතරම් නම් නිදහසක් ද? උවමනා නැති දේ ලංකරගෙන විඳින විඳීමක්! ඔබගේ මගේ මාර්ගෝපදේශකත්වය ඔබ මා ලඟ ඇත. ඒ මාර්ගෝපදේශකත්වයාගේ ක්‍රියා දාමයට අනුගතවීම පමණයි, අපට කරන්න තියෙන්නේ.

''ධ්‍යාන භාවනා'' යනුවෙන් නම් ඇත්තේ කමටහන් වශයෙන් ගන්නා අරමුණ විතක්ක විචාර කිරීමයි. අෂ්ඨ සමාපත්ති යනු එහි විවිධ මට්ටම්ය. එහිදි අරමුණු වන්නේ ලෝක ධර්මයන්ය. **''ලෝක ධර්මයන් අරමුණු කරගෙන සිටීම ධ්‍යානයයි.'' ''නිමිති නොගෙන නිසල මනේ පැවැත්ම භාවනාවයි.''** ධ්‍යාන ලාභීන් ධ්‍යානයට සම්බන්ධ ලෝකයට හේතුවී සිටිති. අනිමිත්තයේ සුඤ්ඤත සමාධියේ විදර්ශනා භාවනාවේ අල්ලගන්න බැසගන්න තැනක් නැත. හේතුව විඤ්ඤානයාගේ ක්‍රියාකාරිත්වය නොමැති නිසා සියලුම සංකත ධර්මයනගේ යථාර්ථය විනිවිද දැනගෙන අරූපි භාවයේ සියුම් ඥාණය වෙත සම්ප්‍රාප්ත විය යුතුය. කෝටි ප්‍රකෝටි ගණන් විශ්ව ශක්ති සමූහයක සණ්හිභූත භාවයෙන් සිදුවන ධර්මතාවය යථාවත්ව අවබෝධයකට

යුතුය. සියලු ශක්තීන්ගේ ස්වභාවය ගණනින් ප්‍රමාණාත්මකව ප්‍රකාශ කළ නොහැකි වෙනස්වීමකි. ''අනිත්‍යතාවය'' විදසුන් නුවණින් ග්‍රහණය කිරීමයි මෙහි යථාර්ථය. එවිට ''ඇත'' හෝ ''නැත'' කියා දෘෂ්ටි ගතවීමට නොහැකි නිර්වින්දනාත්මක සංඥාවේදී සිත නිරෝධයට සමවැදිමට හැකිවනු ඇත. සංඥාවිරහිතවේ. රූපමය විඥ්ඥානය නිරුද්ධ වේ. රූපමය සිතුවිලි මනසිකාරය නොවන්නේ නම් ඒ ශූන්‍යත්වයයි. නො සිතුවිල්ල - විඥ්ඥාන නාම - රූපයාගේ ක්‍රියා විරහිත බවයි.

යෝගාවචර ජීවිතයේ ළඳරු අවස්ථාවේ ඕලාරික අවස්ථාවේ ආරම්භයේ දී සතර සෘද්ධිපාද ක්‍රමානුකූලව වැඩෙනවා. ඡන්ද - චිත්ත - වීරිය - වීමංසා හතරයි. සමථ හෙවත් ලෞකික සමාධියෙන් කාමච්ඡන්දය - ව්‍යාපාදය - ථීන මිද්ධය - උද්ධච්ච කුක්කුච්චය - විචිකිච්චා නීවරණ ධර්‍ම යටපත් කර ''මන'' ශක්තිමත් කර විදර්ශනා සමාධිය වැඩීමට මගපාදා ගනී.

විදර්ශනා සමාධියේ ඉහළම අවස්ථාව වන්නේ. **''න නිමිත්තග්ගාහි හොති, අනුබ්‍යඤ්ජනග්ගාහි නිමිති..''** නිමිති නොගැනීමයි. සුළුවෙන් හෝ කොටස් වශයෙන් හෝ නිමිති නොගැනීමේ තත්‍වයට හිත දියුණුවේ. ළඳරු මානසිකත්‍වය - ඕලාරික බව - නොමේරූ බව නිසා ලෝක ධර්‍මයන්ගේ යථාර්ථය නොදැනීම මත රූප - ශබ්ද - ගන්ධ - රස - පොට්ඨබ්බ - ධම්ම - උලා කෑමේ කෑදර කමේ යෙදේ. ධර්‍මයේ පරිණත බවට පත්වන විට රූපය දැකීම් මාත්‍රයක් පමණි. ශබ්දය ඇසීම් මාත්‍රයක් පමණි. ගන්ධය ආඝ්‍රාණය කිරීමේ මාත්‍රයක් පමණි. ඒ ප්‍රඥාවන්ත ජීවිතයට

සේන්ද්‍රවීමේ මූලාරම්භයයි. අරුණා ලෝකයයි. අරමුණෙහි එල්ලුනොත් ''**විතක්ක - විචාර**'' බවට පත් උනොත් ''**වේදනාවේ**'' කැමැත්තට ඇලී අකමැත්තට ගැටී ''**තණ්හාව**''ට යන බව බුද්ධිමත් යෝගාවචරයා ඉතා පැහැදිලිව සහසුද්ධයෙන් සතිමත්ව දකී.

ඔහු සසරෙහි භය දැක ඇත. මිනිස් බවේ වටිනාකම අවබෝධ කර ඇත. බුද්ධෝත්පාද කාලයන්හි දුර්ලභ බව හොඳාකාරව දනී. චාගෝ - පටිනිස්සග්ගෝ - මුත්ති අනාලයෝ - අත් හැරීමෙන් - මිදීමෙන් - නොඇල්ලමෙන් ලැබෙන ආනිසංශ දැක අප්‍රමාදව වෙසේ. සියලුම රූප - සංඥා - ශබ්ද සංඥා - ගන්ධ සංඥා - රස සංඥා - පොට්ඨබ්බ සංඥා - ධම්ම සංඥා මිරිඟුවක්ය යන විදසුන් නුවණින් දැකීමම ප්‍රඥාවන්ත ජීවිතයම බව වටහාගනී. අල්ලා ගත් දෙයක් හා අල්ලා ගන්නෙක් පනවන තැන ග්‍රාහ්‍ය - ග්‍රාහක දෙකක් විද්‍යාමාන වේ. අල්ලාගන්නෙක් පනවන්න නැත්නම් අල්ලා ගැනීමට දෙයක් විද්‍යාමාන ද නොවේ. සියලුම සංඥා මිරිඟුවක් බව දකින යෝගාවචරයා පනවන ''මමෙක්'' ''පුද්ගලයෙක්'' නොමැති තැන ''කිනම් දෙයක්'' අල්ලා ගන්නේ ද?

> ''සඤ්ඤා විරත්තස්ස න සන්ථි ගන්ථා
> පඤ්ඤා විමුත්තස්ස න සන්ති මොහා
> සඤ්ඤස්ස දිට්ඨිඤ්ච යෙ අග්ගහේසුං
> තෙ ඝට්ටයන්තා විචරන්ත ලොකෙති''
> (ඛුද්දක නිකාය - සුත්ත නිපාත - මාගන්දි සූත්‍රය)

අදහස : සඤ්ඤාවෙහි නො ඇලුන තැනැත්තාට ගැටළු නැත. ප්‍රඥාවෙන් මිදුන හට මුලාවක් නැත. මෝහය නැත. යමෙක් සඤ්ඤා වශයෙන් ගෙන මිසදිටු

බවනේ යුක්තව සිටී නම් ඔහු ලෝකය හා ගැටෙමින් වෙසෙයි. භාගිය තාපස තුමාට උපදේශාත්මකව දුන් කමටහන මීටම අදාල වේ. යෝගාවචරයා රූපයාගේ යථාර්ථය විනිවිද දකින්නේ අභ්‍යන්තර බාහිර රූප පැහී විඤ්ඤාන මායාවට හසු නොවන්නේය.

**''අතන'' රූපය වේ නම් ''මම'' මෙතැන බලමි**
**අතන ගන්ධය වේ නම් මම මෙතැන ගඳ විදිමි**

යන ධර්මතාවය ප්‍රකට වේ. මතුවේ. පැනවේ. චින්තාවන්ගේ ක්‍රියාකාරිත්වය අවබෝධාත්මකව සතියෙන් සිටින යෝගාවචරයා අභ්‍යන්තර රූප - බාහිර රූප ඵස්සයෙන් විඤ්ඤානය හටගෙන නාම ධර්ම ක්‍රියාකාරිත්වය සිදුවන බව දනී. ''**ඉමස්මිං සති ඉදංහොති**'' මෙය ඇති කල්හි මෙය වේ. ඵස්සය නොවුයේ නම් විඤ්ඤානය හට ගන්නේ නැත. ''**ඉමස්මිං අසති ඉදංනහොති**'' මෙය නොවේ. එය භව නිරෝධයයි. මායාවන්ගෙන් මිදීමේ හැකියාව ඇත්තේ රූපයාගේ යථාර්ථය ප්‍රඥාවෙන් දැකීමෙනි. එහිදි නොගැටීමේ ස්වභාවයට ''ආදාන'' නොවීමේ ස්වභාවයට පත්වීමේ ධර්මතාවය පෙන්නුම් කරයි.

මේ බව වඩාත් පැහැදිලි කරන විස්තරයක් අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ පරායන සූත්‍රයේ දැක්වේ.

**''යො උභනෙත්ත විදිත්වාන**
**මජ්ඣෙ මන්තා න ලි ප්පති**
**තං බ්‍රෑමි මහා පුරිසොති**
**සෝධ සිබ්බානි මච්චගා''**

**''යො උභනෙත්ත විදිත්වාන''** යමෙක් අන්ත දෙක (උභය) අග - මුල - දැනගෙන එනම් අභ්‍යන්තර රූපයේ යථාර්ථයත්, බාහිර රූපයේ යථාර්ථයක් දැනගෙන

**''මජ්ඣෙ මන්තා න ලි ප්පති''** ප්‍රඥාවෙන් මැද නො ඇලෙයි. මැද යනු හටගන්නා විඤ්ඤානයයි. **''මායුපමංඤ්ච විඤ්ඤානං''** යන බුද්ධ භාෂිතයට අනුව හටගන්නා විඤ්ඤාන මායාවකි. යමෙක් මුල - අග - මැද - අභ්‍යන්තර රූප (මුල) බාහිර රූප (අග) විඤ්ඤානය (මැද) ගැන නො ඇලේනම් ඔහු මහා පුරුෂයෙක් යයි කයමි. **''සා ඉධ සිබ්බනි මච්චගා''** ඔහු **''සිබ්බනී''** නම් වූ මැහුම් කාරියගෙන් මිදේ. නූල් පොට දෙක ගැට ගැසීම මැහුම් කාරියගේ රාජකාරියයි. අග මුල යා උනේ නැතිනම් ''ගැට'' කොයින්ද? ''ගැට'' යනු තණ්හාවයි.

**අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ ''සෝණ'' සූත්‍රයේ**

**''තණ්හය ක්ඛයාධි මුත්තස්ස**
**අසම්මොහ ඤ්ච චේතසො**
**දිස්වා ආයතනුප්පාදං**
**සම්මා චිත්තං විමුච්චති''**

අදහස :

තණ්හාව නැති කිරීමේ ප්‍රතිපදාවක යෙදී සිටින යොගාවචරයා ඒ සඳහා හිත මෙහෙයවීමේ යෙදෙන්නේ සිත මුලාවෙන් මුදා ගැනීම (අසම්මොහඤ්ච චේතසො) ආයතනයන්හි හට ගැනීම විදසුන් නුවනින් දැක සිත නො අලවා වෙසේ. යථාර්ථය අවබෝධය ඇත්තාට සම්මා

චිත්ත විමුත්තිය උදාවනු ඇත.

සංයුක්තය නිකාය : දේවතා සංයුක්තය : ''සර සුත්ත සූත්‍රය''

**''කුතො සරා නිවත්තන්ති**
**කත්‍ථං වට්ටං නවත්තති**
**කත්‍ථං නාමඤ්ච රූපඤ්ච**
**අසෙසං උපරුජ්ඣතීති''**

සසර ප්‍රවාහය කොහි නවතීද ?
සසර වැහි කො හි නොවසීද ?
නාමයත් රූපයත් කොතැන්හි
නිරවශේෂයෙන් නිරුද්ධ වේද ?

**''අතො සරා නිවත්තන්ති**
**එත්‍ථ වට්ටං නවත්තති**
**එත්‍ථ නාමඤ්ච රූපඤ්ච**
**අසෙසං උප රූජ්ඣතිති''**

යම් තැනක පඨවි - අපෝ - තේජෝ - වායෝ - ධාතුවක් නොපනවයිද නොපිහිටයිද එතැන සසර ප්‍රවාහය නවති. මෙහි සසර වැසී නොමවසීයි. මෙහි නාමයත් රූපයත් නිරවශේෂයෙන් නිරුද්ධ වෙති.

ඇත්ත ඇති සැටියෙන් දැකීමේදී ලෝකයේ මූල ස්වභාවය හෙවත් යථාභූත ඤාණ දර්ශනයේ දී පඨවි - ආපෝ - තේජෝ - වායෝ - ආකාශ - විඤ්ඤාණ ශුද්ධ ධර්‍ම වල ඇති තතු - ස්වභාවය - ප්‍රකෘතිය - ක්‍රියාකාරිත්වය මැනවින් දැනගත යුතුය - අවබෝධ කටයුතුය - තත්වාකාරයෙන් අවධාරණය කළයුතුය. එයයි

පූර්වකෘත්‍යය වන්නේ.

සත්වයා යනුවෙන් සම්මුතිව - ප්‍රඥප්තිව - පනවාගෙන නම්කරගෙන ව්‍යවහාරයේ ඇති මේ ස්වභාව ධර්මය යථාර්ථය ගැඹුරින් අධ්‍යයන කරන්න. සවිඥානකත්වය හෙවත් විඤ්ඤානයාගේ ක්‍රියාකාරිත්වයේ ඉදප්පච්චයතාවය අවධිමත් මනසින් අධ්‍යයනය කරන්න. ශුද්ධ ධම්ම හෙවත් ශක්ති වල ස්වභාවය පටිච්චසමුප්පන බව මැනවින් හැදෑරීමෙන් මතකය අවදි කිරීමෙන් ප්‍රකෘතිය කරා මන මෙහෙයෙවිය හැක. මහා භූත නම් වූ පඨවි ආදි ශක්ති සමූහය මූල ස්වභාවය සාමූහිකත්වයයි. වෙන් නොවන ස්වභාවයයි. වෙනස් වීම - චලනය පටිච්චසමුප්පන්න භාවයේ යථාර්ථයයි. සමූහිතත්වය පදනම්ව විද්‍යාමානවන නිසා පුංජයක් වශයෙන් ඝනිභූත භාවයෙන් ප්‍රකට වේ. මේ ප්‍රකට වීම ''**රූප**'' නමින් සම්මුති නාමය ලෝක ව්‍යවහාරයේ මුලින්ම නම් කිරීම වේ.

මහා භූතයන්ගේ ''රූප'' සංඥාව දුරු කිරීම සඳහා පදාර්ථයන්ගේ (ශක්ති සමූහයේ) පටිච්ච සමුප්පන්න තාවයෙන් ශූන්‍යත්වය ස්වභාවයට පත්වීම ගැන අවබෝධ කටයුතුය.

1. **පඨවි ධාතුව** : සංඥාව වශයෙන් ගත්විට තද ස්වභාවය දරදඬු බව කැඩෙන ගතිය - දියවෙන ගතිය - ප්‍රකෘතියයි - පඨවි නම් ශක්තියේ පදනම ඇතිවීම නැතවීම ශාපේක්ෂතා ධර්මතාවයම වේ. එනිසා ස්වකීයත්වයක් පැනවිය නොහැක. ''ඇත'' කියා දක්වීමට හෝ ''නැත'' කියා දක්වීමට හෝ පැනවීමට කිසිසේත් ඉඩක් නැති සාධාරණ සාධක නැති භාව - අභාව

නොපැනවිය හැකි ස්වභාවයක. පඨවිධාතු වශයෙන් සංඥා විරහිත භාවයට හෙවත් සංඥා නොවන තැනට මන ක්‍රියාකර අමනසිකාරය නම් ධර්මතාවයට පත්වී (මෙනෙහි නොවන තැනට) සංඥාවන්ගේ නිරෝධය නම් වූ නිරෝධ සංඥා ධර්මතාවය ප්‍රකට වීම සිදුවේ. ඒ අවස්ථාව අව්‍යාකෘතයි. චේතනා විරහිත බවකි. එම නිසා පඨවි ධාතුව පදාර්ථයේ දී ශූන්‍යත්වයේ දී සංඥා විරහිත වේ. මේ පදානුගතානුසාරයෙන් මේ ක්‍රමවේදයෙන් සියලුම ධාතුන්ගේ යථාර්ථය නුවනැසින් පැහැදිලි කර ගත යුතුය. යම් කෙනෙක් ගැඹුරු ස්කන්ධ - ධාතු ආදි පදාර්ථයන්ගේ යථාර්ථය විදර්ශනා නුවණින් ගැඹුරින් යථාවත්ව ඇත්ත ඇති සැටියෙන් ප්‍රඥාවෙන් විනිවිද දකීද එවන්නන් දුර්ලභ බව බුදු පියාණන් වහන්සේ පෙන්වා දෙති. ''**නිමිති'' ගැනීමේදී සංඛාර වේ. අනිමිත්තයේ විසංඛාරයි.**

2. **ආපෝ ධාතුව :** ගලායන - වැගිරෙන - දියවෙන - පාවීයන - ඉලිප්පී යන - ඔස්වාගෙන යන - ඩැහැගෙන යන ස්වභාවයයි. පටිච්චසමුප්පාද හෙවත් ඇතිවීම - නැතිවීම මුල ධර්මයට පදනම්ව ඇතිබව හෝ නැතිබව සංඥා ගැනීමට නොහැකි නිසා සංඥා සුන්‍යත්වයට පත්ව අචින්තයෙන් අනිමිත්තයට පත් වේ. (පඨවි ධාතුව ගැන ගෙනහැර දක්වූ කරුණු මීට ද අදාල වේ.)

3. **තේජෝ ධාතුව :** උණුසුම - ශීත ස්වභාවය - දිරවන - දවාලන - පුච්චන ගතිය ප්‍රධානයි. තේජෝ ශක්තිය ද ස්වයම්භූ ජනිත නිසා පටිච්චසමුප්පන්න ධර්මතාවයට යටත්ය. ''ඇති'' බවත් ''නැති'' බවත් සාපේක්ෂව වෙනස් වන නිසා නිත්‍ය වශයෙන් ''ඇත'' - හෝ - ''නැත''

ස්වභාවය පැනවිය නොහැකි බැවින් සංඥා නිරෝධයෙන් සුන්‍ය වේ.

4. වායෝ ධාතුවේ ස්වභාවය හමායන බව - සෙලවෙන බව - පීඩනය - තෙරපුම - පිම්බීම - හැකිලීම - ඔසවාගෙන යාම - පෙරටුකොට ඇත. මෙම ධාතුව ද ඉහත දැක්වූ ධාතුන්ගේ ධර්මතාවයට යටත් නිසා පටිච්චයේදී සුන්‍යවන නිසා ඇත - නැත යනුවෙන් ගැනීමට නොහැකි නිසා නිමිති විරහිතයි.

ධාතු හතරේ සිතිය නොහැකි, කිව නොහැකි, මැනබැලිය නොහැකි, ස්වයම්භූ චලනයක් වේගයක් සාමූහිකව සිදුවන නිසා පුංජයක් ගොනුවක් - පිඩක් වශයෙන් විද්‍යාමාන ස්වභාවයට ''රූප'' යයි සම්මුතිය දී ඇත. එය එනම් ''රූපය'' ආකාශ ධාතුව තුළ ස්ථානගත වීම වේ. සීමාමායිම් වේ. ආකාශ ධාතුවද ශක්තියකි. පටිච්චසමුප්පන්න ධර්මතාවයට එය ද යටත්ය. ඇති වීම නැතිවීම සාපේක්ෂතාවය ඊට ද අදාලය. එහිදී ආකාශ ධාතුවද ප්‍රකට බවේ හිස් ඉඩකඩ තුළ කිසිදු සංඥාවක් ප්‍රකට නොවේ.

විශ්ව ව්‍යාප්ත ආකාශ ධාතුව තුළ සතර මහා භූත නම් වූ ශක්ති සමූහය පටිච්ච සමුප්පන්න වන බැවින් ''රූප'' මතුවේ. එම රූප අභ්‍යන්තර බාහිර රූප වශයෙන් ඝනීභූත වී පුංජයක් වශයෙන් විද්‍යාමාන වේ. මේ ස්වභාව ධර්මතා දෙක හෙවත් අභ්‍යන්තර රූප බාහිර රූප සම්බන්ධීකරනය වීමේ දී ''විඤ්ඤානය'' නම් ශක්තිය ප්‍රකට වේ. මේ සියල්ල ඉදප්පච්චයතාව හෙවත් පටිච්ච සමුප්පන්න ධර්මතාවයට යටත්ය.

**සබ්බේ ලොකො චලිතො**
**සබ්බේ ලොකො පජ්ජලිතො**

සියලු ලෝක ධර්මතා චලිත වේ.
සියලු ලෝක ධර්මතා දිදුලයි.

ශාන්ති නායක දර්ශනය සම්මුති දේශනා - පරමාර්ථ දේශනා වශයෙන් දෙකොටසකි. ඉහත සඳහන් දහම් කරුණු පරමාර්ථ දේශනා හා සම්බන්ධ වේ. එය ප්‍රඥාවට ගෝචර වේ. සියලු හටගත් දේ භෞතිකත්වයෙන් ඔබ්බට ගිය පසු ඉක්මවා ගිය පසු පරමාර්ථ වශයෙන් ප්‍රකාශිත වේ. ඒ ධර්මතාවය ''**අනිදස්සන විඤ්ඤානය**'' යනුවෙන් තථාගත භාෂිතයෙහි වේ. එය අනිමිත්ත - අප්පනිහිත - සුඤ්ඤත නම් ද ව්‍යවහාර වේ. භෞතික මානසිකත්වයට ගෝචර නොවේ.

භෞතිකත්වය මත විස්තර කරන රූපයේ යථාර්ථය විදසුන් නුවනින් දකින ලෙස සුත්ත නිපාතයේ පරායන වග්ගයේ ''**පිංගිය**'' සූත්‍රයෙහි මෙසේ දක්වේ

''දිස්වාන රූපෙසු විහඤ්ඤමානෙ
රුප්පතීති රූපෙසු ජනා පමත්තා
තස්මා තුවං ''පිංගිය'' අප්පමත්තා
ජහස්සු රූපං අපුනබ්භවාය''

රූපය නිමිති වශයෙන්ගෙන රූපය උපාදාන කරගෙන රූපයෙහි මත්වන මිනිසා රූපයේ ධර්මතාවය හේතු කොටගෙන වෙහෙසට පත් වේ. දුකට පත්වේ. වැනසීමට පත්වේ.

එම නිසා ''**පිංගිය**'' ඔබ රූපයේ යථාර්ථය දැක එහි මත්නොවී අනිත්‍ය තාවය - පටිච්චසමුප්පන භාවය

විදසුන් නුවනින් දකිමින් පුනර්භවයකට යාමට හේතු කාරක දුරු කරන්න.

රාධ සංයුක්තයේ ''සත්ත'' සූත්‍රයේ මේ හා සමාන ධර්ම විවරණයක් ඉදිරිපත් කෙරේ.

රාධ තෙරුන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ මෙසේ විචාරති. ස්වාමිනි, ''සත්ත'' ''සත්ත'' යයි කියනු ලැබේ. ''සත්ත යනු කුමක්ද ? රාධ, රූපයෙහි ඇලීමක්, එහි සතුටක් ආශාවක්, කැමැත්තක්, දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයි ද ඒ ''සත්ත'' නම් වේ. එමෙන්ම රාධ, වේදනාවේ ඇල්මක්, එහි සතුටක් ආශාවක්, කැමැත්තක්, දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයිද, ඒ ''සත්ත'' නම් වේ. මේ අයුරින් සංඥා සංඛාර - විඤ්ඤාන ස්කන්ධ පංචකය සම්බන්ධයෙන් සතුටක් - ආශාවක් - කැමැත්තක් - දැඩිව අල්ලාගත් බවක් පෙන්නුම් කරයි ද ඒ ''සත්ත'' නම් වේ.

රාධ, කුඩා දරුවෝ වැලි වලින් ගෙවල් සාදා ක්‍රීඩා කරති. පහව නොගිය ආශාවන්ගෙන් යුක්තවේ. පහව නොගිය කැමැත්ත ඇතිව සිටිති. ප්‍රේමයෙන් පිපාසිත වෙති, ලොල් වෙති, වස්තු කොට ගනිති. ධනය කොට සලකති. මමත්වය ගොඩ නැගේ. යම් දවසක මෙහි යථාර්ථය දැනගත් දාට සියල්ල කෙරෙහි ආශාවෝ පහවෙති. ප්‍රේමය - ආදරය - උවමනාව - කැදරකම - ඇල්ම - ආශාව - ගිජුකම - ඉවත්වී යයි. ක්‍රිඩා කිරීමේ කැමැත්ත නැතිවේ. එසේ රාධ, රූපයාගේ යථාර්ථය දැක විසුරුවා හරින්න. ''තණ්හක්ඛයෝ රාධ නිබ්බාණන්ති''

## ධර්ම දානයේ දායකත්වය

1. ශ්‍රියානි පීරිස් කුලතිලක ම.මිය
2. නිහාල් පිරිස් මයා

නොං 503/2, තලාහේන, මාලඹේ
සරත් පීරිස්, ඕස්ට්‍රේලියාව,

★ අරමුණ :- ගම්පහ, පහලගම 53/E නිවසේ වෂී 35 පෙර අභාවප්‍රාප්ත අර්නස්ට් බෙනඩික්ට් සිඩ්නි පීරිස් පියතුමා.

★ වර්ෂ 16 පෙර අභාවප්‍රාප්ත නිමලා පීරිස් පරණවිතාන මෑණියන්

★ වර්ෂ 5පෙර අභාවප්‍රාප්ත ඕස්ට්‍රෙලියාවේ මෙල්බන් නුවර විසූ වසන්තා පීරිස් සොහොයුරිය

★ සියලුම ඥාතීන්ට හිතවතුන්ට සකල ලෝකවාසී සත්‍වයන්ට පිං පිණිස

★ සියලුම දෙනාට චතුරායෘී සත්‍ය අවබෝධය පිණිස

★ඩබ්. පී. සී විජේසිංහ මැණිකේ මිය.

නොං 223/A, බුත්ගම්පල, දංකොටුව.
එම්.පී තිලකරත්න ඇතුළු සියලු දූදරුවන්ට චතුරායෘී සත්‍ය අවබෝධය සඳහා

★ ධර්මදානය සඳහා නන් අයුරින් ආධාර උපකාර කල සියලුම ධර්මකාමී කුසල කාමී සියලු දෙනාට මේ කුසලය එකාන්තයෙන්ම වේවා සත්‍ය අවබෝධයෙන් නිවන් සුව වේවා.!